# චන්ද්‍රක්කාඃ 71 කැරැල්ලේ කැරලිකාරිනියන්ගේ අමතක කෙරූ භූමිකාව පිළිබඳ සංකේතයක්[1]

සමල් විමුක්ති හේමචන්ද්‍ර

චන්ද්‍රා පෙරේරා, නැතිනම් ඇගේ සමීපතයින්ට අනුව 'චන්ද්‍රක්කා', සිය සැඳෑසමය නිදහසේ ගත කරන්නී ය. දැන් එසේ වූ නමුදු ඇගේ තරුණ කාලය ගත වුණේ සාමාන්‍ය තරුණයකු/තරුණියක ගත කරන ආකාරයෙන් නොවේ. සාමාන්‍ය තරුණයකු/තරුණියක අවුරුදු විසි ගණන්වලදී හොඳ අධ්‍යාපනයක්, ඉස්තරම් රැකියාවක්, පවුලක්, වාහනයක් ගැන සිහින මැව්ව ද චන්ද්‍රක්කා එවැනි සාමාන්‍ය තරුණියක් නොවූවා ය. ඇය ඇගේ සමකාලීන තරුණ පරම්පරාවේ මේ භෞතික සම්පත් අත්පත් කරගැනීමේ සිහිනයෙන් මිදුණු තැනැත්තියක් විය. ඒ වෙනුවට ඇය කළේ ආයුධ භාවිත කිරීම, කරාතේ පුහුණු වීම, ග්‍රාමීය ප්‍රදේශවල පැවතුණු නේවාසික අධ්‍යාපනික කඳවුරුවලට සහභාගී වීම, සංවිධානයට අලුතින් තරුණතරුණියන් හඳුන්වා දීම සහ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම වැනි කාර්යයන් ය. ඇය සාර්ථකව ඇගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය 1969දී නිම කළ ද ඇය පූර්ණකාලීනයකු ලෙස ජනතා විමුක්ති පෙරමුණට (ජවිපෙ) සම්බන්ධ වන්නේ ලැබුණු රැකියා අවස්ථා ද ප්‍රතික්ෂේප කරමිනි. 1971 කැරැල්ලට සම්බන්ධ වීම නිසා ඇය වැලිකඩ සිරගෙදර වසර 6ක් සිරබත් කෑවා ය. මේ නිසා නෑදෑ හිතමිතුරන් පිරිවරාගත් අරුමෝසම් විවාහ මංගල්‍යයක් ගැනීමට ඇයට නොහැකි විය. ඒ වෙනුවට ඇය සේම 'රැජිනගේ ආණ්ඩුවට' එරෙහිව කුමන්ත්‍රණය කිරීම සහ කැරලි ගැසීම යන චෝදනාවට සිරගත කරනු ලැබූ ඇගේ පෙම්වතා සමග සිරගෙය තුළම කුඩා උත්සවයක් පවත්වා ඇය විවාහ වූවා ය. ඇය විශ්වාස කළේ ඇගේ ක්‍රියාවන් ඇයට පමණක් නොව හැමදෙනාටම යහපත උදාවන අනාගතයකට දොරටු විවර කරනු ඇති බවයි. සමානයින්ගේ සමාජයකට.

අද ඇයගේ කතාව කිසිවෙකුත් අසා නැත. එසේත් නැතිනම් අමතක කොට ඇත. ඇගේ පවුලේ සාමාජිකයන්, පැරණි කැරලිකරුවන්, සමීප මිතුරන් ආදී වූ සුළු

---

[1] මෙය දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ සහ ජර්මනියේ රෝසා ලක්සම්බර්ග් පදනමේ අධීක්ෂණය සහ ප්‍රතිපාදන යටතේ සිදු කෙරූ පර්යේෂණයකි.

පිරිසකට පමණි ඇගේ කතාව මතක. මෙය ඇයට පමණක් සීමා වූ දෙයක් නොව 1971දී පෞද්ගලික හෝ සාමූහික අරමුණක් වෙනුවෙන් අරගල කළ සියලුම කැරලිකාරිනියන්ට පොදු වූ යථාර්ථයකි. 71 කැරැල්ල පිළිබඳව ඇති සංඛ්‍යා ලේඛනවලට අනුව අත්අඩංගුවට පත් වී හෝ භාර වී ඒ වනවිට පුනරුත්ථාපන කඳවුරුවල සිටි කැරලිකරුවන් 10,192 දෙනාගෙන් 216 දෙනෙක් ස්ත්‍රීහු වූහ (ඔබේසේකර 1974: 368). මෙම සංඛ්‍යා ලේඛන දෙස බලා පිරිමි කැරලිකරුවන්ට සාපේක්ෂව කැරලිකාරිනියන්ගේ භූමිකාව නොවැදගත් එකක් යැයි යමෙකුට තර්ක කළ හැක. මෙම සංඛ්‍යා ලේඛන පිළිබඳව නිරීක්ෂණය කරන ගණනාථ ඔබේසේකර පවසන්නේ මෙම සංඛ්‍යාවන් වැරදි විය හැකි හෝ කැරලිකරුවන්ගේ සංයුතිය පිළිබඳ නිවැරදි චිත්‍රයක් ලබා නොදෙන හෝ නිසා මෙම සංඛ්‍යාවන් සුපරික්ෂාකාරීව විශ්ලේෂණය කළ යුතු බවයි (ඔබේසේකර 1974: 367-368). කෙසේ නමුත් පිරිමි කැරලිකරුවන්ට සාපේක්ෂව ස්ත්‍රී කැරලිකාරිනියන්ගේ සහභාගීත්වය අඩු යැයි අප පිළිගත්ත ද 1971 කැරැල්ල සම්බන්ධයෙන් ඇති විශාල සාහිත්‍යය තුළ කැරලිකාරිනියන්ගේ භූමිකාව සම්පූර්ණයෙන්ම අමතක කර තිබීම පුදුමයට කරුණකි.

උදාහරණයකට විවිධ පර්යේෂකයන්, පැරණි කැරලිකරුවන් සහ වෙනත් අය 71 කැරැල්ලට අදාළව විවිධ තේමා ඔස්සේ විශාල පරාසයකින් යුත් සාහිත්‍යයක් නිර්මාණය කොට ඇත. 71 කැරැල්ල සම්බන්ධයෙන් ඇති සාමාන්‍ය අදහස වන්නේ එය අවස්ථාවාදියකු වූ ජනතා විමුක්ති පෙරමුණේ රෝහණ විජේවීර විසින් රැකියා විරහිත තරුණ ප්‍රජාව මෙහෙයවා රාජ්‍යයට එරෙහිව කළ අමනෝඥ ප්‍රතික්‍රියාවක් ලෙසට ය (ද සිල්වා 2007 [1971]; අලස් 1979). මෙම අදහසේ මූලික පදනම වන්නේ මෙම තරුණ ප්‍රජාව නායකයකු විසින් නොමගයවනු ලැබූ (අලස් 1979), මානසිකව අස්ථාවර හෝ අතාර්කික ප්‍රජාවක් (බණ්ඩාර 2012) ලෙස හෝ 'අනන්‍යතා අර්බුදයක්' සහ සහජයෙන් එන කැරලිකාරී ආකල්පවලින් යුත් මනෝභාවයන් ඇති පුද්ගලයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් බවයි (ප්‍රනාන්දු 2002). එමෙන්ම කැරැල්ලට පසුබිම් වූ හේතු පිළිබඳ කරන ලද ව්‍යුහාත්මක හෝ සාර්ව මට්ටමේ විශ්ලේෂණ ඇත. ෆ්‍රෙඩ් හැලිඩේ 1971 කැරැල්ල පිළිබඳව කරන සාකච්ඡාවේදී යටත්විජිතකරණයේ සිට 1960 ගණන්වල ඇති වූ ආර්ථික අර්බුදය දක්වා කාලය පිළිබඳ ඓතිහාසික විශ්ලේෂණයක් සිදු කරයි (හැලිඩේ 1971). පොලිටිකස් අවධාරණය කරනුයේ විරැකියාවෙන් සහ අධ්‍යාපනය පුළුල් වීම යන කරුණු ග්‍රාමීය තරුණ ප්‍රජාවට බලපෑ ආකාරය පිළිබඳවයි (පොලිටිකස් 1972).

ගණනාථ ඔබේසේකර 71 කැරලිකරුවන්ගේ සමාජ පසුබිම පිළිබඳව සංඛ්‍යා ලේඛන අධ්‍යයනයක් කරන අතර එහිදී ඔහු ප්‍රශ්න කරනුයේ කැරැල්ලට අදාළව කුලයේ සහ පංතියේ බලපෑම පිළිබඳවයි (ඔබේසේකර 1974). රොබට් එන්. කර්නී ද මීට සමගාමීව ප්‍රකාශ කරනුයේ එක තැන පල්වෙන ආර්ථිකය හේතු කොට ගෙන අධ්‍යාපනයේ ව්‍යාප්තිය තරුණ ප්‍රජාව අතර විරැකියාව වර්ධනය කළ බවයි (කර්නී 1975). වෙනත් ලිපියක කර්නී 71 කැරැල්ලට සම්බන්ධ සහ උතුරේ ආයුධ සන්නද්ධ දමිළ කණ්ඩායම්වලට සම්බද්ධ තරුණයින් එක් කුලකයක් ලෙස ගෙන සංසන්දනාත්මක අධ්‍යයනයක් කරයි (කර්නී 1980). පැරණි කැරලිකරුවකු වන වික්ටර් අයිවන් දක්වනුයේ කුල පීඩනය කැරැල්ලට බලපෑ මූලික හේතුවක් වූ බවයි (අයිවන් 2006). මෙසේ සාකච්ඡා වන තේමා අතර 71 කැරැල්ල සම්බන්ධයෙන් හෝ පශ්චාත්-1970 අවධිය සම්බන්ධයෙන් වන ජනප්‍රිය තේමාවක් වන්නේ ප්‍රචණ්ඩත්වයේ භාවිතාව පිළිබඳව ය. නිරා වික්‍රමසිංහ ජවිපෙ 1971 සහ 1987-1989 කැරලි දෙක ඇතුළත් වන පරිදි 1970 සහ 1990 අතර යුගයෙහි වූ දේශපාලන ප්‍රචණ්ඩත්වය විශ්ලේෂණය කරයි (වික්‍රමසිංහ 2014: 246-263). ජවිපෙ ප්‍රචණ්ඩත්වය වඩා පුළුල් සන්දර්භයක පිහිටුවා විශ්ලේෂණය කිරීමේ අරමුණින් එල්ටීටීඊය ද ඒ හා සමගාමීව සිය විශ්ලේෂණයන්ට ඇතුළත් කිරීමට ගාමිණී සමරනායක උත්සහ කොට ඇත (සමරනායක 1997 සහ 1999).

මෙම ශාස්ත්‍රාලීය සාහිත්‍යයට අමතරව චරිතාපදාන මූලික කරගත් පැරණි කැරලිකරුවන්ගේ ජීවිත කතාවන් මුද්‍රණය වී ඇත. මෙහිදී කැරැල්ලේ මුල් පෙළ නායකයකු වූ ලයනල් බෝපගේගේ (කුක් 2019) සහ ඩී.එම්. කරුණාරත්න නොහොත් කල්‍යානන්දගේ (ජයසිංහ 2019) චරිතාපදාන වැදගත් වේ. **71 කැරැල්ල** (ජයතුංග 2011) නම් කෘතියේ කැරලිකරුවන් 100කට ආසන්න ප්‍රමාණයක සම්මුඛ සාකච්ඡා ප්‍රමාණයක් ඇතුළත් කිරීමට රුවන් ජයතුංගට හැකිවී ඇත. මෙම ලේඛන හරහා අපට කැරැල්ලට සම්බන්ධ කතා සහ පැරණි කැරලිකරුවන් කැරැල්ල සම්බන්ධයෙන් දක්වන ආකල්ප පිළිබඳව අවබෝධයක් ලබා දේ. අවසන් වශයෙන් 1971 කැරැල්ල සම්බන්ධයෙන් ජවිපෙ නිල ප්‍රකාශය ලෙස සැලකිය හැකි ප්‍රකාශන කිහිපයක් තිබේ. මේ අතරින් උදේනි සමන් කුමාරගේ **71 අප්‍රේල් නඩු විභාගය: විජේවීරගේ හෘද සාක්ෂිය** (2016) නම් කෘතිය වැදගත් වේ. එහි මූලික අවධානය යොමු කරනුයේ 71 කැරැල්ලට අදාළ ක්‍රියා වෙනුවෙන් පෙනී සිටීමට, අධානග්‍රාහී ලෙස විජේවීරව වර්ණනා කිරීමට, සහ ඔහුගේ විවේචකන්ගෙන් ඔහුව ආරක්ෂා කිරීමට ය.

ඉහත දැක්වූ ආකාරයට 71 කැරැල්ලේ විශාල පරාසයක් මෙම සාහිත්‍යය තුළ සාකච්ඡා වී ඇත. නමුත් මෙම සාහිත්‍යය තුළ කතා නොකරන ඉතාම වැදගත් ක්ෂේත්‍රය වන්නේ මෙම කැරුල්ල තුළ ස්ත්‍රීන්ගේ කාර්යභාරය පිළිබඳවයි. එනම් මෙහිදී කිව යුතු වන්නේ සුළු අවස්ථා තුනක් හැර මේ පිළිබඳව කිසිම සාකච්ඡාවයක් සිදුවී නොමැති බවයි. මනීෂා ගුණසේකරගේ 'Gender in Counter-State Political Practice of the JVP 1987-1989' නම් ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය තුළ 71 කැරැල්ල හා සම්බන්ධ කැරලිකාරිනියන් තිදෙනෙකුගේ අත්දැකීම් විශ්ලේෂණය වන අතර (ගුණසේකර 1994), නෙලූෆර් ඩි මෙල්ගේ *Women and the Nation's Narrative* කෘතියෙහි එක් කැරලිකාරිනියක් පිළිබඳව සාකච්ඡා කර ඇත (ඩි මෙල් 2001). **71 කැරැල්ල** (ජයතුංග 2011) නම් කෘතියේ සමස්තයක් ලෙස කැරලිකරුවන් 100කට ආසන්න ප්‍රමාණයකගේ සම්මුඛ සාකච්ඡා අන්තර්ගත වුව ද කැරලිකාරිනියන් පිළිබඳව ඇත්තේ සාකච්ඡා 5ක් පමණි. 71 කැරැල්ල සම්බන්ධයෙන් ඇති මෙම හිඩැස ස්ත්‍රීවාදී ශාස්ත්‍රඥවරියන්ගේ අවධානයෙන් ගිලිහී නොමැත. 'ශ්‍රී ලංකාවේ ජවිපෙ ව්‍යාපාරය පිළිබඳ දීර්ඝ ස්ත්‍රීවාදී ලියවීමක් තවම ලියවී නොමැති අතර මෙම කාඩර්වරියන්ගේ අත්දැකීම් තවමත් ලේඛනගත කොට නොමැත' (ඩි මෙල් 2001: 210).

එනමුත් අප දකුණු ආසියාවේ හෝ ලතින් ඇමරිකාවේ බොහෝ රැඩිකල් ව්‍යාපාර සලකා බැලීමේදී එම ව්‍යාපාරවල ස්ත්‍රීන්ගේ දායකත්වයට අදාළව විශ්ලේෂණ සහ/හෝ විවේචන ඇතුළත් පුළුල් සාහිත්‍යයක් දැකිය හැක. ඉන්දියාවේ නැක්සලයිට් ව්‍යාපාරය විශ්ලේෂණය කරන ආකන්ක්ෂා නාරායින් (2017), ස්නේහා කුල්කර්නි (2018) සහ සීමා ශෙඛාවත් සහ වයනිකා සක්සෙනා (2015) තර්ක කරනුයේ මෙයට සම්බන්ධ ස්ත්‍රීන්ගේ ප්‍රචණ්ඩත්වය හරහා පීතෘමූලික අදහස් මෙම ව්‍යාපාරය තුළ අභ්‍යාස වන බව හෝ ප්‍රතිනිර්මාණය වන බවයි. හෙන්රිකේ ඩොනර් (2009) මධ්‍යම පාංතික ක්‍රියාදරයින් අතර පිරිමිබව සම්බන්ධයෙන් වූ පරමාදර්ශයන්ගේ සහ ප්‍රතිමානයන්ගේ වූ වෙනස ගවේෂණය කර ඇත. නැක්සලයිට් සහ තෙභාගා ව්‍යාපාර දෙක ආශ්‍රය කරගෙන දෙබල් කේ. සිංහ රෝයි (1995) සාකච්ඡා කරනුයේ මෙම ව්‍යාපාර දෙක තුළ සිටි ස්ත්‍රීන් කුමනාකාරයෙන් බලගැන්වූවා ද යන්න ය. පීටර් කස්ටර්ස් (1986) පෙන්වා දෙන්නේ ස්ත්‍රීන්ගේ පැහැදිලි කාර්යභාරයක් තිබියදී වුවත් තෙභාගා ව්‍යාපාරය තුළ පුරුෂාධිපත්‍යය ක්‍රියාත්මක වූයේ කෙසේ ද යන්නයි. කවිතා පන්ජාබි (2010)

ඉලා මිත්‍රා නම් තෙභාගා ව්‍යාපාරයේ ජනකාන්ත නායිකාව පුළුල් දේශපාලන සන්දර්භයක තබා සවිස්තරාත්මක විස්තරයක් ලබා දේ. මල්ලරිකා සිංහ රෝයි නැක්සල්බාරී ව්‍යාපාරය පිළිබඳ වාචික ඉතිහාසයන් එක් රැස් කරමින් වැදගත් පර්යේෂණ සිදු කර ඇත. ඇගේ එක් පර්යේෂණයක ඇය උත්සහ දරනුයේ නැක්සල්බාරී ස්ත්‍රීන් භාවිතා කළ 'අරගලයේ ආශ්චර්යමත් නිමේෂයන්' (magic moments of struggle) යන වාක්‍ය ඛණ්ඩයේ බහු අරුත් සාකච්ඡා කිරිමට ය (සිංහ රෝයි 2009). තවත් පර්යේෂණයක ඇය පංති විශ්ලේෂණයෙන් වෙලා ගෙන ඇති නැක්සල්බාරී ව්‍යාපාරය පිළිබඳවූ විශ්ලේෂණයන්ට කුල සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී මානයන් ද අන්තර්ගත කිරීමේ වැදගත්කම සාකච්ඡා කරයි (සිංහ රෝයි 2016).

ලතින් ඇමරිකාවේ විප්ලවීය ව්‍යාපාර, විශේෂයෙන් සැපටිස්ටා ව්‍යාපාරය, ලොව පුරා විසිරී සිටින විප්ලවවාදීන්ගේ ආශ්වාදයට හේතු වී ඇත. සැපටිස්ටා ව්‍යාපාරය තුළ ද ස්ත්‍රීපුරුෂ සමාජභාවී අසමානතා දක්නට ලැබුන ද සැපටිස්ටා ස්ත්‍රීන් ඉහත සඳහන් කළ ඉන්දීය ව්‍යාපාරවල කාන්තා දායකත්වයට සාපේක්ෂව ධනාත්මක ලෙස නියෝජනය වී ඇත. මෙම සන්දර්භය තුළ සැපටිස්ටා ව්‍යාපාරය ස්ත්‍රීපුරුෂ සමාජභාවී අසමානතාව පිළිබඳව සවිංඥානික ය. මක්නිසාද යත් 1970 දශකයේ මෙක්සිකෝවේ පැවති ස්ත්‍රී සම්මන්ත්‍රණයන් 1990 ගණන්වල දී ස්ත්‍රීන්ට දේශපාලන අවකාශයන් විවෘත කර දීමට මග පාදා දුණි (ගාර්සා සහ ටොලේඩෝ 2008). සැපටිස්ටා ව්‍යාපාරය ගැන සාකච්ඡා කරන නීල් හාර්වි (1998) සහ කැරන් කැම්ප්වර්ත් (2002: 83-115) ස්ත්‍රීපුරුෂ සමාජභාවී සමානාත්මතාව අරභයා සිදු වූ ධනාත්මක වර්ධනයන් පිළිබඳව අවධානය යොමු කර තිබෙන අතර රොසල්වා කැස්ටිලෝ (1997) සැපටිස්ටා ව්‍යාපාරයේ ආදිවාසී කාන්තාවන්ගේ වර්ධනයන් සහ පසුබෑම් විශ්ලේෂණය කරයි.

රැඩිකල් ව්‍යාපාරවල ස්ත්‍රීන්ගේ භූමිකාව මේ අනුව බලන විට පුළුල් ලෙස සාකච්ඡා වී ඇති මාතෘකාවකි. මෙවැනි ගෝලීය සන්දර්භයක ඉතා වැදගත් ගැටළුව වන්නේ 1971 කැරැල්ල තුළ ස්ත්‍රියගේ කාර්යභාරය පිළිබඳව එකඳු හෝ පර්යේෂණයක් සිදු වී නැත්තේ ඇයි ද යන්නයි. ඒ ඔවුන් කැරැල්ල තුළ සක්‍රීය දායකත්වයක් ලබා නොදුන් නිසා ද? එසේත් නැතිනම් ජවිපෙ තුළ පවතින පුරුෂමූලිකත්වය ස්ත්‍රීන්ගේ කාර්යභාරය නොවැදගත් යැයි සලකපු නිසා ද? මෙවැනි ප්‍රශ්න පසුබිම්හි තබාගෙන මෙම පර්යේෂණය උත්සහ කරනුයේ

චන්ද්‍රක්කාගේ අත්දැකීම් හරහා 1971 කැරලිකාරිනියන්ගේ දායකත්වයෙහි ඇති වැදගත්කම අවධාරණය කළ හැක්කේ කෙසේ ද යන්න සහ ඔවුන්ව පුළුල් දේශපාලන, සංස්කෘතික සහ සමාජීය වපසරියක පිහිටුවිය හැක්කේ කෙසේ ද යන්න සාකච්ඡා කිරීමට ය. ඒ අනුව, මෙම පත්‍රිකාවෙන් අපේක්ෂා කරනුයේ 1971 කැරැල්ල පිළිබඳ සිය අවධානය යොමු කරන පර්යේෂකයන් කැරැල්ලේ අමතක වී ගොස් ඇති මෙම අංශය පිළිබඳව ද සිතීමට පෙළඹවීමට ය.

## කම්කරුවා හෝ ඩීමෝස්

'මම අයිති වෙන්නේ නිර්ධන පංතියට නෙමෙයි',[2] චන්ද්‍රක්කා පවසන්නී ය. මෙය සත්‍යයකි. ඇගේ පියා පාසලක විදුහල්පතිවරයකු වූ අතර මව පාසල් ගුරුවරියකි. මේවා ආර්ථික ප්‍රතිලාභ සහිත, සමාජයේ හොඳින් පිළිගත් වෘත්ති විය. ඇය ප්‍රධාන පෙළේ දේශපාලකයින්ගේ දැරිවියන් සමග සිංහල බෞද්ධ කාන්තා ළමුන් සඳහා වූ ප්‍රමුඛ පෙළේ කාන්තා පාසලක් වූ කොළඹ විශාඛා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවා ය. 'මගේ ගෙවල් විජේරාමේ. අපිට ඉඩම් තිබුණා. අනික අපි ගොවිගම හින්දා අපිට කුල පීඩනය තිබුණෙත් නෑ [...] මෙතනදි ගත්තම අපි මධ්‍යම පංතියට තමයි වැටෙන්න ඕන. මොකද මටත් රස්සාවක් හම්බුවෙලා නොගියනේ [...] මට පීඩාවක් තිබුණෙත් නෑ, අඩුපාඩුවක් තිබුණෙත් නෑ. ඇත්තටම එහෙම නම් මට රස්සාවකට යන්න තිබුණනේ [...] ඇත්තටම මම ඒ හින්දා කියන්නේ මම පීඩනය හින්දා ජේවිපි ආපු කෙනෙක් නෙමෙයි'. මෙය ඇත්තකි. ඇය කම්කරු පංතියට අයිති නැති අතර කිසි විටෙක කුල පීඩනයට ලක් වී තිබුනේ නැත. 'අපි මධ්‍යම පංතියට තමයි වැටෙන්න ඕන'.

මධ්‍යම පාංතික තරුණ කාන්තාවක 'සූරාකෑමට සහ පීඩනයට ලක් වූ කම්කරු' ව්‍යාපාරයකට (විජෙවීර 1974: 85) ආකර්ෂණය වූයේ කෙසේ ද? ඇය ව්‍යතිරේකයක් ද? අප ඔබේසේකර (1974: 85) උපුටා දක්වන දත්ත ඇතුළත් වගුව සලකා බැලුවහොත් පැහැදිලි වන කාරණාව වන්නේ මෙම ව්‍යාපාරය සමාජයේ සියලු ස්ථරයන් ආකර්ෂණය කර ගැනීමට සමත්වී ඇති බවයි. එම නිසා චන්ද්‍රා

[2] චන්ද්‍රා පෙරේරා සමග 2019 අප්‍රේල් 21 දින ඇගේ නුගේගොඩ පිහිටි නිවසේදී කරන ලද සම්මුඛ සාකච්ඡාව ඇසුරින්

ව්‍යතිරේකයක් නොවේ. එසේනම් චන්ද්‍රා විප්ලවවාදී අරගල කණ්ඩායමක් සමග සම්බන්ධ වීම අප තේරුම් ගන්නේ කෙසේ ද?

| *වෘත්තිමය මට්ටම* | *සංඛ්‍යාව (10,192කුගෙන්)* | *ප්‍රතිශතයක් ලෙස* |
|---|---|---|
| ප්‍රභූන් | 47 | 4 |
| මධ්‍යම | 553 | 5.4 |
| පහළ මධ්‍යම | 1979 | 19.4 |
| ඌන සේවානියුක්තික | 4969 | 48.7 |
| විරුකියා | 260 | 2.5 |
| දක්වා නොමැති | 2214 | 21.7 |
| දක්වා නොමැත නමුත් රුකියාවක් තිබේ | 168 | 1.5 |
| පුජක (ක්‍රිස්තියානි? හින්දු?) | 2 | 0 |
| සමස්තය | 10,192 | 99.6 |

*වගු අංක 1: සැකකාර කැරලිකරුවන්ගේ පියාගේ වෘත්තිමය මට්ටම*

මෙය තේරුම් ගැනීමට නම් අප පළමුව රැඩිකල් ව්‍යාපාරවල පීඩිත සමාජ කණ්ඩායම් හැඳින්වීමට බහුලව භාවිත කෙරෙන කම්කරුවා (proletariat) නම් පදය සාකච්ඡා කළ යුතුය. ශ්‍රී ලාංකික සන්දර්භය තුළ, මාක්ස්ගේ කම්කරුවා නම් සංකල්පය ආර්ථික අවකාශයට ළඝු කොට ඇත. කම්කරුවා යන්න බහුලව අර්ථ දක්වනුයේ ‘නිෂ්පාදන මාදිලීන් අහිමි සහ ජීවත්වීමට තම ශ්‍රමය විකිණීම අනිවාර්ය වූ නූතන වැටුප් ශ්‍රමිකයින්ගේ පංතිය’ ලෙස ය (මාක්ස් සහ එංගල්ස් 1976: 108). ශ්‍රී ලංකාවේ වාමාංශික සහ කම්කරු ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳව වන විශ්ලේෂණවල (ගුණවර්ධන 1960; ජයවර්ධන 2004; ලර්ස්කි 1968) ප්‍රවේශය වන්නේ නාගරික කම්කරුවන්ගේ සහ වතු කම්කරුවන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමට ය. කාර්මික යුරෝපයේ සමාජ කණ්ඩායම්වල කාබන් කොපියක් නොවූව ද මෙම සමාජ කණ්ඩායම් ඉහත දැක්වූ නිර්වචනයට අනුව කම්කරුවා යන්නට ඇතුළත් කළ හැක. මෙම රචනාවල කම්කරු පංතිය සහ වැඩකරන පංතිය යන්න සජාතීය පද ලෙස ලිහිල්ව භාවිත කෙරේ. ‘මාක්ස්වාදී ලිපිලේඛනවල “කම්කරුවා” යන්න භාවිත වන ඕනෑම අවස්ථාවක එයට ලබා දිය හැකි පුළුල්ම තේරුම ලබාදීය යුතුය’ යනුවෙන් ජෝර්ජ් යාන් ලර්ස්කි (1968)

යෝජනා කරන්නේ එබැවිනි. නමුත් මෙම 'පුළුල්ම තේරුම' ඉහත දැක්වූ නිර්වචනය අතික්‍රමණය නොකරයි.

ලෙස්ලි ගුණවර්ධනගේ සහ ජෝර්ජ් යාන් ලර්ස්කිගේ ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳව ලියන ලද රචනාවල ආන්තීකරණය කරන ලද ප්‍රධාන සමාජ කණ්ඩායම් නොසලකා හැර ඇත. මෙහිදී රත්නපුර ප්‍රදේශය මූලික කරගත් පීඩිත කුල කණ්ඩායම්, විශේෂයෙන්ම රුවන්වැල්ල සහ අවට ප්‍රදේශවල සිටි පහළ කුල කණ්ඩායම්, විශේෂ ය. මෙම ප්‍රදේශය දශක ගණනාවක් පුරාවට වාමාංශික කණ්ඩායම්වල බලකොටුවක් වී තිබුණි. නමුත් කුල ක්‍රමය වැඩවසම් ව්‍යුහයක් වීමත් පහළ කුල කණ්ඩායම් ඉහත දැක්වූ මාක්ස්ගේ නිර්වචනයට ඇතුළත් නොවීමත් නිසා වඩා අවධානය යොමුවී තිබෙන්නේ ආර්ථිකමය වශයෙන් වඩාත්ම ගතික කණ්ඩායම වූ කොළඹ නාගරික කම්කරු පංතියට ය.

ගෝලීය සහ ලාංකීය සන්දර්භ තුළ කම්කරුවා යන්න වැටුප් ලබන ශ්‍රමිකයාට ලඝු කිරීමට මූලික වශයෙන් බලපා ඇත්තේ සෝවියට් දේශයේ සාහිත්‍යයයි. එම සාහිත්‍යයට අනුව නාගරික කම්කරු පංතිය සිදු කළ පෙරටුගාමී බලපෑම හේතුවෙන් රුසියානු විප්ලවය අර්ථදක්වනුයේ කම්කරු විප්ලවයක් ලෙස ය. රුසියානු කම්කරු පංතිය මාක්ස්ගේ නිර්වචනය සංතෘප්ත කරන බැවින් එය කම්කරුවා පිළිබඳ නිල නිර්වචනය බවට පත් වී ඇත. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය සෝවියට් රුසියාව සහ එහි දේශපාලන දර්ශනයන් (මූලික වශයෙන් ට්‍රොට්ස්කිවාදය සහ ස්ටාලින්වාදය) සමග තිබූ සමීප සම්බන්ධය නිසා සමාජ කණ්ඩායම් කම්කරුවා යන්නට ඇතුළත් කිරීමට සහ නොකිරීමට අදාළ මිනුම්දණ්ඩ ලෙස මෙම නිර්වචනය යොදා ගෙන ඇත.

කම්කරුවා යන පදය තවත් සංකීර්ණ කරන්නේ නම් දැක්විය හැක්කේ 'පංති' ප්‍රවේශය 1971 කැරැල්ල පිළිබඳ සාහිත්‍යය තුළ සම්පූර්ණයෙන්ම නොසලකා හැර තිබීම ය. එයට මූලික හේතුව වන්නේ සාම්ප්‍රදායිකව කම්කරු පංතිය ලෙස සලකන නාගරික කම්කරුවන්ගෙන් සහ වෘත්තීය සමිතිවලින් කැරලිකරුවන්ට සහය එයට නොලැබීම ය. මෙයට ප්‍රතිපක්ෂව කැරැල්ල පැවතුණු කාලය තුළ මෙම කණ්ඩායම්වල සම්පූර්ණ සහය ලැබුනේ කැරැල්ල මර්දනය කරන ආණ්ඩුවට ය. අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවට දෙන ලද සාක්ෂි සම්පාදනය කිරීමෙන් කරන ලද 1971 කැරැල්ල පිළිබඳ නිල පඨිතයට අනුවත් මෙය සලකනු ලබන්නේ 'ජනතා නැගිටීමක්' (කුමාර 2016: vi) ලෙස ය. එමෙන්ම පුදුමයට

කරුණ වන්නේ මෙම කැරුල්ල කම්කරු පංතිය සමග සම්බන්ධ කිරීමට කිසිදු උත්සාහයක් දරා නොතිබීමයි.

එසේ නම් ඇයි විජේවීර 1973 නොවැම්බර් මාසයේදී අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව ඉදිරියේ කළ කතාවේදී කම්කරුවා යන්න නැවත නැවත භාවිත කළේ? උදාහරණයකට ඔහු සිය කතාව ආරම්භ කරන්නේ විශිෂ්ට ලෙස යඃ 'එක් සමාජ පංතියක නියෝජිතයෙක් තවත් සමාජ පංතියක නියෝජිතයන් ආමණ්ත්‍රණය කරයි. මෙතන සිදුවන්නේ එයයි. සූරා කෑමට සහ පීඩාවට ලක්වන කම්කරු පංතියේ නියෝජිතයෙක් සූරා කන සහ පීඩාවට ලක් කරන පංතියේ නියෝජිතයන් ආමන්ත්‍රණය කරයි' (විජේවීර 1974ඃ 85). එමෙන්ම ඔහු ඔහුගේ කතාව ඉවර කරන්නේ 'ඇත්ත වශයෙන්ම ධනපති අරමුණට මෙම සාර්ථකත්වය සැමරීමට කිසිදු හේතුවක් නොමැත. පංති අරගලයේ ජයග්‍රහණය මාරුවෙන් මාරුවට සිදුවන අතර එය අවසන් වන්නේ කම්කරු පංතියේ ජයග්‍රහණයෙනි. අපගේ විශ්වාසය එයයි. මම මෙතනින් මගේ සාක්ෂිය අවසන් කරමි' (1974ඃ104). මෙහිදී විජේවීර දැන සිටියේ නැද්ද 'කම්කරුවා' යන්න ඔහු සංවිධානය කරන පංතීන්ට ආදේශ කළ නොහැකි බව? නැතිනම් මෙම පදය පිළිබඳ ඔහුට වෙනස් කියවීමක් තිබුණි ද?

මාක්ස්ගේ සාහිත්‍යය තුළ කම්කරුවා පිළිබඳව තිබූ එකම නිර්වචනය ඉහත දැක්වූ නිර්වචනය නොවේ. 1844දී පළ කරන ලද *A Contribution to the Critique of Hegel's Philosophy of Right* හි මාක්ස් කම්කරුවා යන්න නිර්වචනය කරන්නේ 'සිවිල් සමාජයට අයිති වන නමුත් සිවිල් සමාජයට අයිති නොවන පංතිය' ලෙස ය. මෙම නිර්වචනය පිළිබඳව අදහස් දක්වන පීටර් ඔස්බෝන් සඳහන් කරනුයේ 'කම්කරුවා' සිවිල් සමාජයට අයිති පංතියක් වන්නේ 'එය ධනවාදි ආර්ථිකයේ කේන්ද්‍රීය කොටසක්' වන නිසා ය. එමෙන්ම එම මොහොතේදීම ඔවුන් සිවිල් සමාජයේ පංතියක් නොවන්නේ 'සිවිල් සමාජයට ආර්ථිකය පමණක් නොව කම්කරුවා බැහැර කරනු ලබන යුක්තිය පිළිබඳ පරිපාලනය (දේපල නීතිය) සහ ආර්ථික අභිලාෂයන්ගේ දේශපාලන නියෝජනය යන්න ද අන්තර්ගත කරන බැවිනි' (ඔස්බෝන් 2006ඃ 68). එම නිසා කම්කරුවා වන්නේ සමාජයේ ශ්‍රමය වගුරවන පංතිය නොව සමාජයෙන් 'බැහැරකරන ලද' පංතිය ය. දැන් ප්‍රශ්නයක් මතු වේ. මෙම නිර්වචනයන් දෙකෙන් මාක්ස් තමන්ව ප්‍රතික්ෂේප කර ගන්නවා ද? මාක්ස්ගේ කාලයේදී යුරෝපයේ

'කම්කරුවා' හෝ සමාජයෙන් බැහැර කරන ලද කණ්ඩායම වූයේ 'නිෂ්පාදන මාදිලීන් අහිමි සහ ජීවත්වීමට තම ශ්‍රමය විකිණීම අනිවාර්ය වූ නූතන වැටුප් ශ්‍රමිකයින්ගේ පංතිය' යි. ඒ අනුව 'කම්කරුවා' යනු බැහැර කරන ලද පංතිය යන්න කම්කරුවා පිළිබඳ ගණිය තේරුම් ගැනීම ලෙස සැලකිය හැකි අතර කම්කරුවා යනු වැටුප් ලබන ශ්‍රමික පංතිය යන්න නිශ්චිත සමාජ සන්දර්භයක් තේරුම් ගැනීම සඳහා ඇති ද්විතික අර්ථකථනයක් ලෙස සැලකිය හැක. ඒ අනුව ගත් කල මාක්ස් විසින් තමන්වම ප්‍රතික්ෂේප කර ගැනීමක් සිදු කරගෙන නොමැත. සිදු වී ඇත්තේ කම්කරුවා යන්නට විවිධ භූගෝලීය සහ කාලමය අවකාශයන් අන්තර්ගත කර හැකි ආකාරයේ පුළුල් අර්ථකථනයක් ලබාදීමයි. කෙසේ නමුත් මාක්ස්ගෙන් පසුව ධනවාදයේ සිදුවූ වර්ධනයන් හේතු කොට ගෙන මෙම නිර්වචන දෙක අතර පවතින වෙනස පුළුල් වී ඇත. වෙනත් වචනවලින් කියන්නේ නම් වර්තමාන සමාජය තුළ තවදුරටත් ශ්‍රමය වපුරන පංතිය සමාජයෙන් බැහැර කරන ලද පංතිය වන්නේ නැත.

අප 'කම්කරුවා' පිළිබඳ මෙම සාකච්ඡාව ශ්‍රී ලංකා සන්දර්භය තුළ ස්ථානගත කළහොත්, අපූරු පිංතූරයක් අප ඉදිරියේ මැවේ. 1930 ගණන්වල සිටි නාගරික කම්කරුවන් 'කම්කරුවා' යන්නට ඇතුළත් කළ හැකි වන්නේ ඔවුන් එම කාලය තුළ සමාජයෙන් බැහැර කරන ලද කණ්ඩායමක් වන බැවිනි. නමුත් වාමාංශික ව්‍යාපාරයේ වර්ධනයට කේන්ද්‍රීය කාර්යභාරයක් කළ සබරගමුව ප්‍රදේශය ආශ්‍රිතව සිටි පීඩිත කුල කණ්ඩායම් 'කම්කරුවා' යන්නට ඇතුළත් කළ නොහැක. මක්නිසාද යත් ඔවුන් සිවිල් සමාජයෙන් බැහැර කරන ලද කොටසක් වූවත් ඔවුන් ධනවාදී ව්‍යුහය තුළ කළ කාර්යභාරය ඉතා සීමිතවීමත් ඔවුන් තවදුරටත් වැඩවසම් ක්‍රමයේ කොටසක් ලෙස පැවතීමත් ය. 1971 කැරැල්ලේ සමාජ සංයුතිය තුළ සැලකිය යුතු පරිද්දෙන් ගුරුවරුන්, රජයේ ලිපිකරුවන්, මධ්‍යම ශ්‍රේණීන්ට අයත් රජයේ නිලධාරීන්, වතු කම්කරුවන් සහ රැකියා විරහිත පිරිස් (අතිරේක ශ්‍රම බලකාය) සිටින ලදී (ඔබේසේකර 1974: 373). මෙම කණ්ඩායම් 'කම්කරුවා' යන්නට ඇතුළත් කළ හැක. නමුත් ධනවාදී ක්‍රමය තුළට තවම ග්‍රහණය කර ගෙන නොමැති ශිෂ්‍යයන් (ඔබේසේකර 1974: 373), ගම්වල සිටින රැකියා විරහිත තරුණ පිරිස්, හේන් ගොවීන්, අඳ ගොවීන් සහ බත්ගම සහ වහුම්පුර වැනි පීඩිත කුල ආදී වශයෙන් වූ කණ්ඩායම් 'කම්කරුවා' යන්නට අයත් නොවනුයේ ධනවාදී ආර්ථික ව්‍යුහයත් සමග ඔවුන්ට තිබූ සම්බන්ධය අවමවීම නිසා ය. එම නිසා තරුණ මාක්ස්ගේ 'කම්කරුවා' පිළිබඳ නිර්වචනය 1930 ගණන්වල සිදු වූ

වාමාංශික ව්‍යාපාරයේ වර්ධනය සමග හෝ 1971 කැරැල්ල සමග හෝ ආදේශ කළ නොහැක.

1971 කැරැල්ල සම්බන්ධයෙන් ගත් කල තරුණ මාක්ස්ගේ නිර්වචනය කම්කරුවා පිළිබඳව ඇති සාම්ප්‍රදායික තේරුම් ගැනීම විචාරශීලීව විමසා බැලීමට අවශ්‍ය ඉඩ ලබා දේ. එනම් නාගරික කම්කරු පංතිය හෝ සාම්ප්‍රදායිකව කම්කරුවා යයි සලකනු ලැබූ පිරිස් තරුණ මාක්ස්ගේ 'කම්කරුවා' යන ප්‍රවර්ගයට අයත් වන්නේ නැත. ඉතාම ශක්තිමත් වාමාංශික ව්‍යාපාරය සහ වෘත්තීය සමිති ව්‍යාපාරය නිසා නාගරික කම්කරු පංතිය රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්ගෙන් විශාල වරප්‍රසාද ලබා ගන්නා ලදි. ඒ හේතුවෙන් මෙම සමාජ කණ්ඩායම්වල සමාජ වටිනාකම ඉහළ ගිය අතර තව දුරටත් ඔවුන්ව සමාජයෙන් 'බැහැර කරන ලද' පංතිය ලෙස සැලකිය නොහැක. 1920 ගණන් සහ 1930 ගණන්වල මෙන් නොව නාගරික කම්කරු පංතිය 1960 ගණන් සහ 1970 ගණන් වන විට තරුණ මාක්ස් අර්ථකථනය කළ පරිදි 'කම්කරුවා' නොවීය.

එම කාලයේ සිටි සාම්ප්‍රදායික වාමාංශික නායකයන්ට සාපේක්ෂව විජේවීර ධනවාදී රාජ්‍යයට එරෙහි කැරලි ගැසීමට පීඩිතයන් සංවිධානය කිරීමේ අරමුණ අරභයා කම්කරුවා පිළිබඳ සාම්ප්‍රදායික මාක්ස්වාදී නිර්වචනයේ ඇති සීමාකම් දැන සිටියේ ය. සාම්ප්‍රදායික මාක්ස්වාදී අර්ථයෙන් වූ කම්කරුවා යන කණ්ඩායම සමාජ ක්‍රමයට අන්තර්ග්‍රහණය කරගෙන ඇති බවට ඔහු තේරුම් ගෙන තිබුණි. එම නිසා ඔහු ගම්වල සිටි රැකියා විරහිත තරුණ පිරිස, හේන් ගොවීන් සහ අඳ ගොවීන් ඇතුළත් කරමින් කම්කරුවා යන ප්‍රවර්ගය පුළුල් කළේ ය. ඔහුගේ තර්කය වූයේ මෙම කණ්ඩායම් ධනවාදී අර්ථ ක්‍රමයට දායකත්වයක් නොදැක්වුව ද 'තම ශ්‍රමය විකුණා ජීවත් වීමට කිසිදු ඉඩක් නොමැති නිසා' (සමරනායක 1990: 270) ඔවුන්වත් කම්කරුවන් ලෙස සැලකිය හැකි බවයි.

1971 කැරැල්ල පිළිබඳ එහි නායකයාගේ දෘෂ්ටිකෝණය මාක්ස්වාදී න්‍යායාත්මක ප්‍රවේශයකින් ඉදිරිපත් වුව ද පළමුවන වගුව පෙන්වා දෙන පරිදි කම්කරුවා පිළිබඳ මාක්ස්වාදී අරුත්ගැන්වීම්වලට හසු නොවන කණ්ඩායම්, එනම් පීඩාවට සහ සූරාකෑමට ලක් නොවූ සමාජ කණ්ඩායම්, 1971 කැරැල්ල තුළ අපට දැක ගත හැකිය. අප චන්ද්‍රාගේ සමාජ පසුබිම සලකා බැලුවහොත් ඇයම කියන පරිදි ඇය මෙම කම්කරුවා කියන සමාජ කණ්ඩායමට හසුවන්නේ නැත. නමුත් ඇගේ මධ්‍යම පාංතික සහ ඉහළ කුල පසුබිම නොසලකා හරිමින් අනෙක් අය හා

සමපාත වන යම් කිසි පොදු දෙයක් මෙම කැරැල්ල තුළ තිබුණි. මෙම පොදු දෙය තේරුම් ගැනීමට අපට ජාක් රොන්සියෙර් ඩීමෝස් පිළිබඳව කරන කියවීම 'කම්කරුවා' යන්න අතික්‍රමණය කරමින් කැරලිකරුවන්ගේ සමාජ සංයුතිය අවබෝධ කරගැනීමට පිටිවහල් ලබා දේ.

පැරණි ග්‍රීක සමාජය තුළ ඩීමෝස් යනුවෙන් හැඳින්වුයේ දුප්පතුන්ට ය. මෙහිදී 'දුප්පතුන්' යනුවෙන් හැඳින්වුයේ 'ජනගහනයෙන් ආර්ථිකමය වශයෙන් අවාසිදායක තත්වයක සිටින කාණ්ඩයට නොව' බලය පාවිච්චි කිරීම සඳහා කිසිදු හිමිකමක් නොමැත්තේ යැයි පූර්වකල්පනය මත පාලනය කිරීම සඳහා 'ගණනය නොකරන ලද ජනතාව ය' (රොන්සියෙර් 2010: 32). බලය පාවිච්චි කිරීම සඳහා වූ හිමිකම තීරණය වුයේ 'ජ්‍යෙෂ්ඨත්වය, උපත, ධනය, සුචරිතය හෝ දැනුම' මත ය (රොන්සියෙර් 2010: 32).

1971 කැරැල්ලට මෙම ඩීමෝස් පිළිබඳ කියවීම ආදේශ කළහොත් කිව හැකි වන්නේ මෙයට සහභාගී නොවූ නාගරික කම්කරුවන් සහ වෘත්තීය සමිතීන් වාමාංශික දේශපාලන පක්ෂ හරහා බලය පාවිච්චි කිරීමට සහභාගී වූ බවයි. එනම් සමාජය තුළ ඔවුන් 'ගණනය කරන ලද කොටසට' අයත් වේ. මෙය 20 වන ශතවර්ෂයේ ආරම්භයේ ඔවුන්ගේ සමාජ මට්ටම හා සලකා බැලූ කල විශාල පරිවර්තනයකි. 1971 කැරැල්ලට සම්බන්ධ වූවන් පිළිබඳව සැලකීමේදී කිව හැකි වන්නේ කුල පීඩනය, ඉංග්‍රීසි දැනුම අඩුවීම, දේශපාලන බලය අහිමිවීම හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවී අසමානතා වැනි කාරණා නිසා ඔවුන් සමාජයෙන් 'ගණනය නොකරන ලද කොටසට' අයත් බවයි. කුලය කැරැල්ල තුළ ප්‍රධාන කාර්යයක් සිදු කර ඇත. කැරැල්ල පැවතුන කාලයේ කැරැල්ල ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වුයේ වහුම්පුර කුලය සිටි ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටියේ සහ බත්ගම කුලය සිටි කෑගල්ල දිස්ත්‍රික්කයේ ය (ඔබේසේකර 1974: 372). 1950 දශකයේ අගභාගයේ සිට අධ්‍යාපනය ගම්බද ප්‍රදේශවලට ද ව්‍යාප්ත වුණු නමුත් එමගින් සමාජය තුළ පැවති සමාජ වෙනස්කම් තව තවත් පැහැදිලිව පෙනෙන්නට වුණි. එනම් කොළඹ සහ ප්‍රධාන නගර කිහිපයක තිබූ වරප්‍රසාදිත පාසල් හරහා ප්‍රවර්ධනය කළ ජීවන විලාසයන් සමාජයේ අතිබහුතරයකට ළං විය නොහැකි ඒවා විය. මේ සන්දර්භය තුළ ඉංග්‍රිසි භාෂාව ප්‍රභූන්ගේ සන්නිවේදන මාධ්‍යයක් වීම නිසා සමාජයෙන් මිනිසුන් 'ගණනය නොකිරීමට' ඉංග්‍රීසි භාෂාව තීරණාත්මක කාර්යභාරයක් කරන ලදි (ඔබේසේකර 1974: 372). වාමාංශිකයන් ද ඇතුළුව සියලුම ප්‍රධාන

දේශපාලන පක්ෂවල නායකයින් මෙම ප්‍රභූ පාසල්වලින් පැමිණි අය වූ අතර බටහිරට ගොස් ලැබූ අධ්‍යාපනය හේතු කොට ගෙන ඔවුහු පාලනය කිරීම සඳහා බලය තිබූ, එසේත් නැතිනම් සමාජය තුළ 'ගණනය කරනු ලැබූ' කොටසට අයත් වූහ. අවසාන වශයෙන්, සමාජය තුළ වූ සියලුම කර්තව්‍යයන් දේශපාලනීකරණය වූ මෙම කාලය තුළ සමාජය තුළ 'ගණනය කරනු ලැබීමට' නම් දේශපාලන බලය තිබීම අනිවාර්ය විය. ඔබේසේකර පෙන්වා දෙන ආකාරයට බොහෝ අවස්ථාවල රජයේ රැකියාවක් ලබා ගැනීමට මන්ත්‍රීවරයෙකුගෙන් රෙකමදාරුවක් තිබීම තිබිය යුතු එකම සුදුසුකම විය. එම රෙකමදාරුව ලබා ගැනීමට ඔබ එක්කෝ මන්ත්‍රීගේ අතකොලුවක් විය යුතු ය, නැතිනම් මන්ත්‍රීට පගාවක් දිය යුතු ය (1974: 381).

මීළඟ කොටසේදී සාකච්ඡා කරන පරිදි ස්ත්‍රීපුරුෂ සමාජභාවී අසමානතාව චන්ද්‍රා කැරලිකාරිනියක බවට පත් කිරීමට තීරණාත්මක කාර්යභාරයක් කරන ලදි. මෙම කාරණා හරහා සමාජයෙන් කොටසක් 'ගණනය කරනු නොලැබීමට' නැතිනම් පාලනය කිරීම නැමැති ක්‍රියාවෙන් ඉවත් කිරීම නම් ක්‍රියාවලිය පෙන්වා දේ. මේ ආකාරයට පෙන්වා දෙන පරිදි ඩීමෝස් පිළිබඳ රොන්සියෙර්ගේ කියවීම තුළ 1971 රැඩිකල් දේශපාලනය විවිධ සමාජ ස්ථරයන්ගෙන් විවධාකාර පුද්ගලයන් සම්බන්ධවීම පිළිබඳ අදහසක් ගත හැක.

## ස්ත්‍රී කැරැල්ලක්

ගණනය කරනු නොලැබූ කොටසේ ආකෘතියට පිටුපස තිබෙන තර්කනය කුමක් ද? අප වෙනත් විදියකට මෙය අසන්නේ නම් මධ්‍යම පාංතික ගොවිගම තරුණියක වූ චන්ද්‍රා ගණනය කරනු නොලැබූ කොටසට අයත් වූයේ කෙසේ ද?

> මම ඉස්කෝලේ ඉන්න කාලේ තර්ක කරන කොට විවාද කරන කොට පාර්ලිමේන්තුවේ සෙනෙට් එකේ එන් එම් පෙරේරලා වගේ අය කියපු දේවල් අරං තමයි තර්ක කළේ. මම එන් එම්ලගේ පොත් කියවනවා, හැන්සාඩ් එක කියවනවා. ඉතිං ඒවා තුළ අර හැඟීම අපි අතර ඇති වෙලා තිබුණා. නැතුව අම්මලගේ කවුරුත් දේශපාලනේට බර වෙලා තිබුණේ නෑ. ඒක ඉතිං කැම්පස් ගියාම වැඩි වුනා [...] කැම්පස් එකට ගියාම ගොඩාක් දුක් විඳින කැම්පස් ළමයි දැක්කා. ඒ වගේම එයාලා

අතරට යන්නත් අපිට පහසු වුනා එයාලගේ මේ ප්‍රශ්නත් එක්ක. ඒවත් එක්ක තමයි මම ගොඩක් මේ දේශපාලනේට ඇදිලා ආවේ.

ඔනෑම තරුණියක සමාජය තුළ අනෙක් අය විඳින දුක පිළිබඳ දැන සිටීම මගින් ඇයව ගණනය කරනු නොලබන කොටසට ඇතුළත් වන්නේ නැත. නමුත් චන්ද්‍රා ගණනය කරනු නොලබන කොටසට අයත් වන්නේ ඇය අනෙකා විඳින දුක දැකීමෙන් පමණක් නොනැවතී මෙම මර්දනකාරී සමාජ පර්යායට විරුද්ධව සහ අනෙකා විඳින දුක තුරන් කිරීම වෙනුවෙන් 'ක්‍රියා කිරීමට' කටයුතු කළ නිසා ය. ජවිපෙට සම්බන්ධ වීම පිළිබඳ පද්මලතා රාජපක්ෂගේ[3] අත්දැකීම මෙම ක්‍රියා කිරීමට තිබෙන ආකල්පය වඩා විස්තර කරයි. වර්තමානයේදී පද්මලතා නයනානන්දගේ[4] බිරිඳ වන අතර තරුණියක්ව සිටි කාලයේ ඇගේ මිතුරිය වන නයනානන්දගේ නැගණියව මුණ ගැසීමට නිතරම ඔහුගේ නිවසට ගියා ය. 'එක දවසක් එයා [මිතුරිය] මගෙන් ඇහුවා "අපි කවදාහරි දවසක මැරෙනවා. ඉතිං ඔයා කැමති ද යමක් කරලා මැරෙන්න, එහෙම නැත්තම් සාමාන්‍ය කෙනෙක් විදියට මැරෙන්න". මම කිව්වා "යමක් කරලා මැරෙන්න මම කැමතියි" කියලා. "එහෙනං අද හවස පංතියක් තියෙනවා ඒකට එන්න" කිව්වා'. ආරම්භයේ සිටම සමස්ත ව්‍යාපාරයම නිර්මාණය කර තිබුණේ විප්ලවීය අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙනි. මෙය සමාජ යහපත වෙනුවෙන් වැඩ කිරීමට කැමති බොහෝ දෙනාගේ ආකර්ෂණයට ලක් විය. දෙවන පෙළ නායකයකු වූ වසන්ත දිසානායක එය මෙසේ විස්තර කරයිඃ

හැමකෙනාටම දැනිච්ච දෙයක් තමයි මේ විප්ලවය නම් කෙරෙනව කියලා. දැන් අපි වැඩකරපු ශෛලිය, අපි කරපු කතාබහ, ඒවා ගත්තම කියන්නේ ස්ථිර ලෙසම මේ කතා කරන දෙය සිදුවෙනවයි කියන විශ්වාසය හැම කෙනා තුළම ගොඩනැගිලා තිබුණා [...] අපි එක පැත්තකින් සන්නද්ධ අරගලය ගැනනේ කතා කළේ. ඊළගට පටන් ගත්ත තැන ඉඳලම ඒකට අවශ්‍ය දේවල් එකතු කරමින්නේ හිටියේ. ඒ කියන්නේ හැකියාව තිබිච්ච මුල් අවස්ථාවේ ඉඳලම අපි වෙඩි බෙහෙත්, පතරොම් ඒවා මේවා එකතු කිරීමේ ක්‍රියාවලියත් පටං

[3] පද්මලතා රාජපක්ෂ සමග 2019 ජූනි 18 දින අම්බලන්ගොඩ පිහිටි ඇයගේ නිවසේදී කරන ලද සම්මුඛ සාකච්ඡාව ඇසුරෙන්.

[4] කලුතර දිස්ත්‍රික් ලේකම් වූ නයනානන්ද ව්‍යාපාරය තුළ දෙවන පෙළ නායකයෙක් ය. ඔහුගේ අත්දැකීම් පසුව සාකච්ඡා කෙරේ.

> ගත්තා. මහා පරිමාණයෙන් නෙමෙයි [...] අනික ඉතා රහසිගත ආකාරයෙන්නේ යන්නෙත්. වැඩ කිරීමේ ශෛලියෙනුත් සහභාගිවෙන්නන්ට හැඟෙනවා යමක් සිදුවෙනවා කියලා.

ඉහත සඳහන් කළ ආකාරයට, මෙම ව්‍යාපාරයේ අරමුණ වූයේ සාම්ප්‍රදායික වාමාංශික දේශපාලන පක්ෂවලට අලුතින් සාමාජිකයින් බඳවා ගැනීමට ඇති නොහැකියාව නිසා ඇති වී තිබූ හිඩස පිරවීමට ය. සාම්ප්‍රදායික වාමාංශික පක්ෂවල මෙම නොහැකියාවට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ මෙම දේශපාලන පක්ෂවල නායකයින් ඔවුන්ගේ මූලික දේශපාලන අරමුණුවලින් විතැන් වී ඇතැයි යන ජනතා විශ්වාසයයි. මෙම සන්දර්භය තුළ ජවිපෙට සමාජයේ සුභසිද්ධිය උදෙසා ක්‍රියාකිරීමට පුද්ගලයින් පොළඹවා ගැනීම වෙනුවෙන් ආමන්ත්‍රණය කළ අතර, ජවිපෙ සහ කැරලිකරුවන්/කාරිනියන් සමාජයේ අවශේෂ පුද්ගලයන්ගෙන් වෙනස් වීමට මෙය හේතුවක් විය.

එම නිසා චන්ද්‍රා සහ ඇගේ සහෝදර කැරලිකරුවන්/කාරිනියන් සමාජය වෙනස් කිරීම වෙනුවෙන් ක්‍රියා කිරීම නිසා ඔවුන් 'ගණනය කළ නොහැකි කොටස' බවට පත්වන ලදි. ගණනය කළ නොහැකි කොටසේ අයකු ලෙස චන්ද්‍රා පවතින සමාජ පර්යායේ අවකාශය සහ කාලය බණ්ඩනය වන ආකාරයට විකල්ප අවකාශයක සහ කාලයක ජීවත් වූවා ය. පැවති සමාජ පර්යායේ කුමන කාලයක් හා අවකාශයක් මත ද ඇය ක්‍රියා කළ යුතුව තිබුණේ? 'කවුරුත් හිතුවේ රස්සාවක් කරලා කසාදයක් බැඳලා, ඒ වගේ තත්වයක්නේ තිබුනේ. දැන් කැම්පස් ළමයි හිටියේ කොහොමහරි ඩිග්‍රිය කරලා ගමට ගිහින් රස්සාවක් කරන්න. ඒ කතන්දරේනේ හුගක් තියෙන්නේ'. මේ අවධියේදී 1956 ජාතිකවාදී දේශපාලන ව්‍යාපාරයේ පිරිමින්ට සහ කාන්තාවන්ට භාර දී තිබූ භූමිකාවන්, ක්‍රියාකාරකම් සහ මිනිස් හැසිරීම් පවරනු ලැබූ ලිංගික ශ්‍රම විභජනයේ බලපෑම බලවත්ව පැවතුණි. බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ සිටි බටහිරකරණය වුණු ක්‍රිස්තියානි කාන්තාවන්ට එදිරිව සිංහල බෞද්ධ කාන්තාවගේ නැගීම ඉතා හොඳින් පර්යේෂණයට ලක් වී ඇති ක්ෂේත්‍රයකි. බ්‍රිතාන්‍ය කාලයේ ආ බෞද්ධ පුනරුදය පිළිබඳව සාකච්ඡා කරන කුමාරි ජයවර්ධන සිංහල බෞද්ධ වාර්ගිකත්වය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී ප්‍රතිමානය අතර තිබූ සමීප සම්බන්ධතාව නිසා කාන්තාවන් පාලනය කිරීම මූලික වශයෙන් පැවතියේ 'වාර්ගික කණ්ඩායම වෙනුවෙන් ළමයින් බිහිකිරීම සහ එම

ළමයින්ව තමන්ගේ වාර්ගික භූමිකාවන් වෙනුවෙන් සමාජගත කිරීම කළහැකි දරුවන් වදන වයසේ' සිටින කාන්තාවන් මත ය (ජයවර්ධන 1994: 113).

> [කාන්තාව] පාලනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භවනුයේ මල්වර වීමේ සිට සහ දැරියගේ වැඩිවියට පැමිණීමේ පළමු සංඥාව ලැබීමත් සමගම ය. ඇය වැඩී ඇත; ඇය දැන් ලිංගිකව ක්‍රියාකාරී අතර විවාහ වී ළමයින් සෑදීමට පුලුවන. ඇගේ කන්‍යාභාවය සහ පතිව්‍රතය රැකගෙන ඇත්නම් සහ ඇයව නිසිපරිදි තොරාගනු ලැබූ සහකරුවෙක් හා විවාහ කර ඇත්නම් සහ නීතිය සහ සමාජ චාරිත්‍රවලට අනුකූලව ළමුන් සාදා බලා කියා ගන්නේ නම් ඇය එම ප්‍රජාවට විශිෂ්ට වස්තුවක් සහ ත්‍යාගයකි. අනෙක් අතට, ඇය සම්ප්‍රදායන් උල්ලංඝනය කරයි නම් ඇය එම වාර්ගික කණ්ඩායම අවුල් කරවන උවදුරක් වේ; එවිට ඇය 'අයාලේ යාම' සහ වාර්ගික කණ්ඩායමේ පාරිශුද්ධත්වය කෙලෙසන මිශ්‍ර වාර්ගික ළමයින් බිහි කිරීම හරහා තම ප්‍රජාවට ලැජ්ජා කිරීම යන අවදානම්වලට [එම වාර්ගික කණ්ඩායම] ලක් කරන්නී ය. ආර්තවභාවයට පත්වීමෙන් පසු වැඩිමහලු කාන්තාවන් නොවැදගත් වන අතර ඔවුන්ගෙන් 'හොඳ' මිත්තණියකගේ භූමිකාව රඟදැක්වීම බලාපොරොත්තු වන නමුදු තරුණියකට නොමැති යම් අවකාශයක් සහ එහා මෙහා යාමේ හැකියාවක් ලැබේ (ජයවර්ධන 1994: 113)

'පශ්චාත්-යටත්විජිත රාජ්‍යය සැකැස්ම තුළ සිංහල-බෞද්ධ වාර්ගික-ජාතිකවාදය හෙජමොනික ප්‍රවාහයක් බවට පත් වූ සිද්ධියක්' (විජේසිංහ 2008: 19) ලෙස 1956 මැතිවරණ ජයග්‍රහණය තේරුම් ගන්නා ශානිකා විජේසිංහ නූතන ශ්‍රී ලාංකික නාට්‍යයේ ආරම්භය සලකුණු කරන **මනමේ** (1956) සහ **සිංහබාහු** (1961) යන නාට්‍ය දෙක තුළ ඉහත සඳහන් කළ කාන්තා ලක්ෂණ පුනරුච්චාරණය වී ඇති ආකාරය මනාව පෙන්වා දෙයි. මෙම නාට්‍ය දෙක සිංහල බෞද්ධ සමාජය තුළ ස්ත්‍රීපුරුෂ සමාජභාවී ප්‍රතිමාන තහවුරු කිරීම සඳහා විශාල බලපෑම් කළ අතර වර්තමානයේ පවා නිරන්තරයෙන් රඟ දක්වන අතර විවිධ අවස්ථාවල පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කර ඇත. මෙම නාට්‍ය දෙක විශ්ලේෂණය කිරීමෙන් විජේසිංහ පෙන්වා දෙන්නේ ස්ත්‍රීපුරුෂ සමාජභාවී භූමිකාවන්ගේ ඒකාකෘතීන් (stereotypes) සමාජය තුළ මුල් බැස ගන්නේ කෙසේ ද යන්න ය. මනමේ තුළ ප්‍රධාන නළුවා වන කාන්තාව සිය සිතැඟි අනුව

කටයුතු කරන්න ගොස් විෂමලිංගික සහ පුරුෂමූලික පවුල් සම්ප්‍රදායන් බිඳ වට්ටවයි.

> පවතින සාම්ප්‍රදායික සමාජය හෝ පර්යාය කාන්තාවට ඇය අභිමත පරිදි තීරණ ගැනීමට ඉඩ නොදෙන අතර ඇය තම අභිමතය පරිදි පවුලේ හෝ සම්ප්‍රදායේ තර්කනයට විරුද්ධව ක්‍රියා කළහොත් එමගින් පර්යාය දැඩි අර්බුදයකට පත්වේ. **මනමේ** තුළ පර්යාය නිරතුරුවම නිර්මාණය කරන්නේ සහ පවත්වා ගෙන යන්නේ පිරිමි චරිත විසිනි [...] පර්යාය, සම්ප්‍රදාය, රාජ්‍යය, ස්ථාවරත්වය හෝ අවංකභාවය පිරිමියා සමග සම්බන්ධ කරන විට ව්‍යාකූලබව, වංකභාවය, සැකය හෝ අපිළිවෙල කාන්තාව සමග බද්ධ කරයි (විජේසිංහ 2008: 32).

**සිංහබාහු** තුළ 'අහිංසකකම, පාරිශුද්ධකම, කැපවීම, සානුකම්පිකබව ආදී පද භාවිතය හරහා කාන්තාව නිරූපණය කොට ඇත්තේ පිරිමියාට උදව්කරන, ද්විතියික සහ දුර්වල ස්ථානයක ය. කාන්තාව ඇයව ස්ථානගත කරනුයේ පිරිමියාගේ, එනම් ඇයගේ පියාගේ, ස්වාමිපුරුෂයාගේ, පුතාගේ හෝ ගුරුවරයාගේ සෙවණැල්ල යටතේ ය' (විජේසිංහ 2008: 32). අප දුටු පරිදි මෙම නාට්‍ය සමාජය තුළ කාන්තාවගේ යටහත්පහත් ස්ථානය පුනරුච්චාරණය කරයි.

කාන්තාවගේ මෙම යටහත්පහත් ස්ථානය 1957 අප්‍රේල් 19 දින **වනිතා විත්ති** නම් පුවත්පතේ 'මෙම ඇඳුම නරක ද?' යන ලිපිය තුළ මනාව පෙන්වයි.

> නියම කාන්තාව කිසිවිටෙකත් පිරිමියා සමග තරඟ කරන්නේ හෝ පිරිමි චාරිත්‍රවාරිත්‍ර උකහා ගන්නේ හෝ නැත. ඇය ඇයගේ මට්ටමෙන් හෝ අධ්‍යාපනයෙන් ඉහළට ගිය ද ඇගේ ස්ත්‍රීත්වය කිසිදා නැති කර ගන්නේ නැත. නමුත් අද කාලේ තරුණියන් කලින් පිරිමින්ට පමණක් තිබූ අමාරු ක්‍රීඩාවන් කිරීමට විශාල කැමැත්තක් දක්වයි. එම නිසා ලැජ්ජාවෙන් සහ බියෙන් ආරක්ෂා කර ගැනීමට අලුත් ඇඳුමක් අවශ්‍ය ය. රැළි සායවල් වැනි කෙටි ඇඳුම් ඇඳීම හෝ වොලිබෝල් වැනි ක්‍රීඩාවක නිරත වීම නීච ක්‍රියාවකි. මන්ද ඒවායෙන් මැවෙන සංකල්ප රූප සහ හැඟීම් අධම වන අතර ලැජ්ජබයකින් තොරව ප්‍රසිද්ධියේ තරුණ වැඩෙන ගැහැනු ළමුන්ගේ ශරීර නිරාවරණය වීම රටේ සංස්කෘතියට නොගැලපේ (ජයවර්ධන 2006: 103 තුළ).

කාන්තාව පිරිමියාට දක්වන යටහත්පහත්කම සහ ඔවුන් ගෘහයට කොටු කර තිබීම කලාපීය ප්‍රපංචයක් නොව ගෝලීය ප්‍රපංචයකි. ඉන්දියාවේ ගැමිගොවි ව්‍යාපාරවල ස්ත්‍රීන්ගේ කාර්යභාරය සාකච්ඡා කරන සිංහ රෝයි මෙසේ පවසයිඃ

> ඉපැරණි සම්ප්‍රදායන්, විශ්වාසයන්, වටිනාකම්, සිරිත්විරිත්, අධ්‍යාපන සහ සමාජීයකරණයන් හරහා ගැමිගොවි සමාජයක ස්ත්‍රීන්ගේ සමජීය සහ ආර්ථික භූමිකාවන් ව්‍යුහගත කර ඇත. එම භූමිකාවන් ස්ත්‍රීපුරුෂ සමාජභාවී පදනමක් සහිත වන අතර සමාජ අන්තර් ක්‍රියාකාරකම්වලදී පිරිමින්ගේ සහ ස්ත්‍රීන්ගේ සහභාගීත්වය ස්ත්‍රීපුරුෂ සමාජභාවය විසින් මූලික වශයෙන් තීරණය කරයි. ව්‍යුහගත කිරීමේ සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය ඒකාකෘත කිරිමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රීන්ව පහළ සමාජ තත්වයකට කොටු කරයි (සිංහ රෝයි 1995ඃ 2306).

වෙනත් භූගෝලීය ඒකකයක් වන ලතින් ඇමරිකාවේ ආයුධ සන්නද්ධ අරගලවල පවතින ස්ත්‍රීපුරුෂ සමාජභාවී දේශපාලනය විශ්ලේෂණය කරන ස්ටෙෆෙන් ඩබ්. ශ්මිට් ලතින් ඇමරිකානු ස්ත්‍රීන්ගේ පහළ සමාජ තත්වයට බලපාන පුරුෂමූලික ආකල්ප මෙසේ ලැයිස්තුගත කරයිඃ

1. ලිංගික ශ්‍රම විභජනය පිරිමින්ගේ සහ ස්ත්‍රීන්ගේ ස්වභාවික වෙනස්කම් නිරූපණය කරයි.
2. ස්ත්‍රීන්ගේ අනන්‍යතාව ඔවුන් පිරිමින් සමග පවත්වන සම්බන්ධතාව හරහා තීරණය වේ.
3. ස්ත්‍රීන් සිය ජීවිතයේ උපරිම සතුට ලබා ගන්නේ භාර්යාවන් සහ මව්වරු ලෙස ය.
4. ස්ත්‍රීන් ළමුන් වැනි ය.
5. ස්ත්‍රීන් අදේශපාලනික ය (රීෆ් 1986ඃ 148 තුළ).

මෙය අපට පෙන්වා දෙන්නේ ස්ත්‍රියගේ යටහත්පහත්භාවය ශ්‍රී ලංකාවේ වේවා, ඉන්දියාවේ වේවා නැතිනම් ලතින් ඇමරිකාවේ වේවා කොතනත් එක බවයි. ඉහත ලක්ෂණ සලකා බැලීමේදී පෙනී යන්නේ ස්ත්‍රීන් මත පටවා ඇත්තේ පෞද්ගලික/මහජන පරිමණ්ඩල දෙබෙදුම පමණක් නොවන බවයි. 'තවත් එකක් වන්නේ ස්වභාවධර්මය/ශිෂ්ටාචාරය කියන බෙදීමයි. ස්ත්‍රියව "ස්වභාවධර්මය" සමග අනන්‍ය කිරීම ඔවුන්ව "ශිෂ්ටාචාරගත" මහජන පරිමණ්ඩලයෙන් බැහැර කිරීමට හේතු වනවා පමණක් නොව (ග්‍රාන්ට් 1991) එමගින් සියලුම සංස්කෘතිවල

සමාජීය වශයෙන් ස්ත්‍රිය පිරිමියාට වඩා නොවැදගත් යැයි සිතීමට අවශ්‍ය පැහැදිලි කිරීම ලබා දේ' (යුවාල්-ඩේවිස් 1997: 5). එක සමානව මෙම දෙබෙදුම් ස්ත්‍රියව පෞද්ගලික පරිමණ්ඩලයේ ස්ථානගත කරන අතර මහජන පරිමණ්ඩලයෙන් බැහැර කරනු ලබයි.

එම නිසා පවතින සමාජ පර්යායේ අවකාශය සහ කාලය සලකා බැලීමේදී අපට පැහැදිලි වන්නේ ස්ත්‍රීන්ට බොහෝ විට නියමිත අවකාශය වන්නේ පෞද්ගලික පරිමණ්ඩලය වන නිවස වන අතර කාලය ලබා දී තිබෙනුයේ ළමුන් සහ ස්වාමිපුරුෂයා රැක බලා ගැනීමට ය. ස්ත්‍රීන්ට කරන්න අවසර ලබා දී තිබෙන ගුරුවෘත්තිය වැනි රැකියාවන් පවතින පර්යායේ අවකාශය සහ කාලය බණ්ඩනය කිරීමට ඉඩ ලබා නොදේ.

නමුත් චන්ද්‍රා සහ අනෙකුත් කැරලිකාරිනියෝ සාමාන්‍ය ස්ත්‍රීන්ව ස්ථානගත කර ඇති පවතින පර්යායේ අවකාශය සහ කාලය ප්‍රශ්නකරන්නාවූ විකල්ප අවකාශයක සහ කාලයක කටයුතු කරන්නෝ ය. එම නිසා අවශ්‍ය නම් අපට 1971 කැරැල්ල ස්ත්‍රී කැරැල්ලක් ලෙස ද නම් කළ හැක. 'ගම්වල ගත්තම ගම්වල [ස්ත්‍රීන්] දේශපාලනය කරන එක පිළිගන්නෙම නැති තැනකනේ තියෙන්නේ. එහෙම වෙලාවක අපි [ස්ත්‍රීන්] ගිහින් තුවක්කු අරං ගම්වල දේශපාලය කරන කොට එතන ස්ත්‍රියගේ කැරැල්ලකුත් තියෙනවා'. මෙම ස්ත්‍රීන් සාම්ප්‍රදායික ජීවිතයක් ගත කළා නම් ඔවුන් කෑම පිසීම, රෙදි සේදීම සහ පවුල බලා ගැනීම වගේ දේ කර කර ඉඳීවි. ඒ වෙනුවට ඔවුහු පිරිමින් පමණක් කරන 'දේශපාලනය' කළෝ ය.

ජවිපෙ විසින් එඬේරමුල්ල සහ මොරගහහේන වැනි කොළඹින් පිට සංවිධානය කර තිබූ අධ්‍යාපන කඳවුරුවලට චන්ද්‍රා සම්බන්ධ වූවා ය. ඒවායේදී ඇය කරාතේ සහ මූලික ආයුධ පුහුණුවක් ලැබුවා ය. එමෙන්ම නුවරඑළිය උසාවියේ ඇසූ විජේවීරගේ නඩුවට ද ඇයගේ සගයන් සමග කොළඹ සිට සහභාගී වූවා ය.

> එඬේරමුල්ලේ කඳවුරක හිටියා. මම ගියපු පළවෙනි එක තිබ්බේ මොරගහහේනේ. එතන [විශ්ව විද්‍යාල] ශිෂ්‍යයෝ වගේ අපි කට්ටියක් හිටියා. ඒකට මමත් සහභාගි වෙන්නේ [විශ්ව විද්‍යාල] ශිෂ්‍යයෙක් හැටියට. ඒවට ගෙදරින් පිට ගිහින් ඉන්නේ ගෙදරට දහසක් බොරු කියලා. පස්සේ පස්සේ අම්මට අහුවුනා. හැබැයි දැන ගන්නකොට ඉවරයි වැඩේ. ඉස්සර [විජේවීරගේ] නුවරඑළියේ නඩුවලට යන්නෙත් බොරු කියලා, උදේ ගිහින් හවස එනවා.

ඇය ව්‍යාපාරයට අලුතින් තරුණ අය සම්බන්ධ කර දුන්නා ය (කොකු ගහනවා); 1969දී තමන්ට ලැබුණ රැකියාව ද ප්‍රතික්ෂේප කරමින් පූර්ණකාලීනයකු ලෙස ජවිපෙට සම්බන්ධ වූවා ය. මෙම විකල්ප අවකාශය සහ කාලය තුළ ජීවත් වූ චන්ද්‍රාට බාහිර සමාජය බල කර සිටියේ ගෙදරට වෙලා වැඩක් පලක් කිරීම සහ දෙමව්පියන්ගේ රැකවරණය යටතේ ජීවත් වීමට ය. මේ මුකුත් නොකොට ඇය තීරණය කළේ ඇය ඇය කැමති අවකාශවල රැඳීමට ය. තරුණියක ලෙස පවතින සමාජ පර්යාය ඇගෙන් බලාපොරොත්තු වූයේ තමන්ගේම කියා පවුලක් තැනීම ය. නමුත් අපගේ කැරලිකාරිනිය තම කාලය වැය කළේ කළ නොයුතු, එසේත් නැතිනම් කිරීමට සිතීමට පවා බැරි දේවල් කිරීමට ය. ඇගේ මේ කිසිම වැඩක් පවතින සමාජ පර්යායේ ආරක්ෂකයින් වන දෙමව්පියන් දැන සිටියේ නැත. මන්ද ඇය ඔවුන්ට බොරු කීවා ය. මේ සන්දර්භය තුළ බොරු කීම යනු පවතින යථාර්ථයෙන් ගැලවීමට තනනා විමුක්තිකාමී ක්‍රියාවකි.

චන්ද්‍රාගේ අත්දැකීම්වලට අනුව අපට ජවිපෙ යනු ලිංගික ශ්‍රම විභජනය පිළිබඳ සවිඥානික දේශපාලන ව්‍යාපාරයක් ලෙස සැලකිය හැකි ද? ජනතා විමුක්ති පෙරමුණේ ඓතිහාසික ගමන්පථය දිහා බැලීමේදී එසේ සැලකිය හැක වැනි නිගමනයකට පැමිණීම බොළඳකමකි. නමුත් ඉහත ප්‍රශ්නය තේරුම් ගැනීමට නම් අපට ව්‍යාපාරය තුළ භාවිත වුණු ධූරාවලීගත සහ පුරුෂමූලික ප්‍රතිමාන අවබෝධ කරගැනීම අවශ්‍ය ය.

## ජවිපෙ තුළ පැවති පර්යාය

ජවිපෙ එහි ආරම්භයේ පටන් 1971 වෙනතුරු ඉතාම සංකීර්ණ සහ දැඩි ධූරාවලීගත ව්‍යුහයන්ගෙන් යුක්ත විය. චන්ද්‍රා සහ මධ්‍යම කාරක සභිකයින් දෙදෙනෙකු වූ කෝට්ටේ[5] දිස්ත්‍රික් කමිටු ලේකම්, නිමල් මහරගේ[6] සහ ශිෂ්‍ය අංශයේ ලේකම් වූ සුනිල් රත්නසිරි[7] සමග කරන ලද සම්මුඛ සාකච්ඡා හරහා

[5] කෝට්ටේ දිස්ත්‍රික්කයට වර්තමාන කොළඹ දිස්ත්‍රික්කයට අයත් රාජගිරිය, කැස්බෑවේ සිට අවිස්සාවේල්ල දක්වා ප්‍රදේශය අයත් විය.

[6] නිමල් මහරගේ සමග 2019 මැයි 20 දින ඔහුගේ නුගේගොඩ පිහිටි නිවසේදී කරන ලද සම්මුඛ සාකච්ඡාව ඇසුරින්.

[7] සුනිල් රත්නසිරි සමග 2019 ජූනි 5 දින ඔහුගේ මත්තෙගොඩ පිහිටි නිවසේදී කරන ලද සම්මුඛ සාකච්ඡාව ඇසුරින්.

නිර්මාණය කරන ලද පහත දැක්වෙන රූපසටහන ජවිපෙ තිබූ ධූරාවලී ව්‍යුහය පැහැදිලි කරන අතර එය ඔස්සේ තර්ක කළ හැක්කේ ඉහළ සිට පහළට සමස්ත ජවිපෙ සාමාජිකත්වය මනාව සංවිධානය කර තිබූ බවයි.

පහත දැක්වෙන රූප සටහන පිළිබඳව දළ හැඳින්වීමක් කරන්නේ නම් මෙම ධූරාවලිය තුළ විජේවීර ප්‍රධාන ලේකම් ලෙස ඉහළින්ම සිටයේ ය. ඔහුට පසුව, විජේවීර ද ඇතුළත් 5-6 දෙනෙකුගෙන් යුත් දේශපාලන මණ්ඩලය (politburo) තිබුණි. දේශපාලන මණ්ඩලය යටතේ ව්‍යුහයන් දෙකක් විය. එකක් සාමාන්‍ය පක්ෂ යාන්ත්‍රණය වූ අතර අනෙක ශිෂ්‍ය අංශය විය. සාමාන්‍ය පක්ෂ යාන්ත්‍රණය තුළ 15 දෙනෙකුගෙන් සමන්විත මධ්‍යම කාරක සභාව දේශපාලන මණ්ඩලයට පහළින් තිබුණි. සියලුම මධ්‍යම කාරකසභිකයින් දිස්ත්‍රික් ලේකම්වරුන් වූ අතර ඔවුන්ව තෝරා පත් කරගන්නා ලද්දේ දිස්ත්‍රික් කමිටු නියෝජනය කිරීමට ය. මෙහිදී මතක තබා ගත යුතු දෙය වන්නේ දිස්ත්‍රික්ක ලෙස ජවිපෙ භාවිත කළේ රාජ්‍යය විසින් නිර්මාණය කරන ලද පාලන ඒකක නොව තමන් විසින්ම සාදාගත් භූ ඒකකයක් බවයි. දිස්ත්‍රික් කමිටුව පොලිස් කමිටු ලේකම්වරුන්ගෙන් සමන්විත විය. සෑම පොලිස් කමිටුවක්ම ලේකම්වරයෙකු ඇතුළු පස් දෙනෙකුගෙන් යුතු වූ අතර ලේකම්වරයා එම කණ්ඩායමේ නියෝජිතයා විය. මෙම ධූරාවලිය තුළ සෑම කැරලිකාරුවෙක්ම පහේ කණ්ඩායමක සාමාජිකයෙක් විය. මෙම ව්‍යුහයම ශිෂ්‍ය අංශය තුළ දක්නට ලැබුණි. ශිෂ්‍ය අංශ ධූරාවලිය තුළ දිස්ත්‍රික් කමිටු නොතිබූ අතර සියලුම පොලිස් කමිටු ලේකම්වරු නායකවරු දෙදෙනෙකු යටතේ ක්‍රියාත්මක වුණු අතර ඔවුහු දෙදෙන දේශපාලන මණ්ඩල සභිකයෙකු වූ එස්.වී.ඒ පියතිලකගේ අනුදැනුම යටතේ ක්‍රියා කළහ. කාන්තා අංශය පසුකාලීනව පියතිලක යටතේ ආරම්භ කෙරූ අතර මෙම කාලය වන විට එය පැවතියේ වර්ධනය වෙමින් පවතින අවධියක ය. කාන්තා අංශය ශිෂ්‍ය අංශයෙන් නිර්මාණය වූවක් වන අතර මෙම අංශ දෙක අතර කිට්ටු සම්බන්ධතාවක් පැවතුණි.

මෙම සමස්ත ව්‍යුහයම පිරමිඩයක ආකාරයෙන් සකස් කර තිබුණි. එහි තිබූ සුවිශේෂී ලක්ෂණය වූයේ අංශ එකිනෙක අතර තිබූ හුදකලාවයි (isolation). මෙම ධූරාවලිය තුළ වූ සෑම ඒකකයක්ම තනි තනිව ක්‍රියාත්මක විය. එනම් පහේ කණ්ඩායමේ කිසිම සාමාජිකයෙකු අනෙක් පහේ කණ්ඩායම් පිළිබඳව දැන සිටියේ නැත. පොලිස් කමිටු සාමාජිකයන් අනෙක් පොලිස් කමිටු දැන සිටියේ නැත. මේ ආදි වශයෙන් කිසිවකු තමන්ගේ අයත් වගකීමට එපිටින් දෙයක් දැන

සිටියේ නැත. මෙම සමස්ත ව්‍යුහයම දේශපාලන මණ්ඩලයේ සහ මධ්‍යම කාරක සභාවේ අනුදැනුමට යටත් විය. මෙසේ සාමාජිකයින් දැඩි හුදකලාකරණය හරහා එකිනෙකාගෙන් වෙන් කිරීම ක්‍රියාකාරකම්වල රහස්‍යභාවය රැක ගැනීමට සහ නිශ්චිත ක්‍රියාකාරකම් ඉෂ්ට කිරීමට උපකාරී විය. මෙම පර්යාය තුළ සෑම සාමාජිකයකුටම නිශ්චිත ස්ථානයක් සහ වගකීමක් තිබූ අතර මෙය පවරන ලද්දේ නායකත්ව මණ්ඩලය විසිනි. එමෙන්ම පැවතුණු දැඩි රහස්‍යබාවය නිසා කිසිවකුටත් තමන්ට පවරනු ලැබූ ස්ථානයෙන් සහ වගකීමෙන් ගැලවී වෙනත් ස්ථානයකට සහ වගකීමකට මාරු වීම ඉතාම අසීරු විය. මේ විදියට සැලකූ කල්හි විමුක්ති දේශපාලන ව්‍යාපාරයකට මෙවැනි දෘඪ ව්‍යුහයක් තිබිය හැකි ද? (මීළඟ පිටෙහි රූපසටහන බලන්න)

මෙම දෘඪ ව්‍යුහය ව්‍යාපාරයේ විමුක්තිවාදී සාරයට එරෙහි යැයි කියා ජවිපෙ විවේචනය කළ හැක. මෙම ධූරාවලිය සහ විමුක්තිය කියන විසංවාදය දිහා අප ලංවී බැලුවහොත් මෙවැනි ධූරාවලිගත ව්‍යුහයක් ජවිපෙ නායකත්වයට අවශ්‍ය වී තිබුණේ යැයි කියා අපට තර්ක කළ හැක. එනම් මෙම දෘඪබව සහ දැඩි රහස්‍යභාවය ජවිපෙ දේශපාලනයට අත්‍යවශ්‍ය වූයේ එහි ආරම්භයේ සිටම එහි ප්‍රධාන අරමුණ වූයේ ආයුධ සන්නද්ධ අරගලයක් හරහා රාජ්‍ය බලය අල්ලා ගැනීම වන අතර සමස්ත සාමාජිකත්වයම සංවිධානය කරන ලද්දේ මෙම අරමුණ වෙනුවෙනි. මෙම කාලයේදී ජනප්‍රිය විප්ලවීය මාදිලීන් තුනක් පැවතිනි. පළමුවැන්න වූයේ කම්කරු පංතිය සංවිධානය කරමින් 1917දී රාජ්‍ය බලය ලබා ගත් රුසියානු මොඩලයයි. දෙවැන්න වූයේ ග්‍රාමීය ප්‍රදේශවල ගැමිගොවීන් සංවිධානය කරමින් දිගුකාලීන ආයුධ සන්නද්ධ අරගලයක් කොට 1949දී බලයට පත් චීන මොඩලයයි. මෙම කාලය තුළ ලංකාවේ තරුණයින් අතර වඩාත්ම ජනප්‍රිය විප්ලවීය මාදිලිය වූයේ තෙවැන්නක් ය. එනම් කියුබානු විප්ලවයයි. එයට ගම්බදව ප්‍රබල මිලිටරි බලයක් ද නගරබදව දේශපාලන බලයක් ද තිබූ අතර රාජ්‍ය බලය අල්ලා ගැනීමේදී මිලිටරි ව්‍යාපාරයට වඩා වැඩි වැදගත්කමක් ලැබුණි. සමකාලීනත්වය සහ ෆිදෙල් කැස්ත්‍රෝ හා චේ ගුවේරා වැනි ජනකාන්ත නායකයින් නිසා රුසියන් සහ චීන මාදිලි දෙකට සාපේක්ෂව තරුණයින් අතර කියුබානු විප්ලවය වඩා ආකර්ෂණීය මාදිලිය විය. නමුත් ලංකාවේ සන්දර්භය තුළ මේ මාදිලීන් තුන හරහා බලය ලබා ගත නොහැකි බව විජේවීර තේරුම් ගත්තේ ය. ජවිපෙට ඒ වෙනකොට 'කම්කරු පංතිය' විප්ලවය වෙනුවෙන් සංවිධානය කිරීමට හැකියාවක් නොතිබ්බේ ඒ වන විට ලංකා සමසමාජ පක්ෂය සහ ලංකා

*(රූප සටහන් අංක 1)*



කොමියුනිස්ට් පක්ෂය විසින් එය සම්පූර්ණයෙන්ම පාහේ සිය අනසකට ගෙන තිබූ නිසා ය. එමෙන්ම ඉහත සාකච්ඡා කළ ආකාරයට කම්කරු පංතිය

සාම්ප්‍රදායික වම දියත් කළ අරගල නිසා සමාජ ධූරාවලිය තුළ ඉහළට ඔසවා තිබූ අතර ඒ හේතුවෙන් තරුණ මාක්ස්ගේ දෘෂ්ටිකෝණයට අනුව තවදුරටත් ලංකාවේ කම්කරු පංතිය 'කම්කරු පංතිය' නොවීය. එමෙන්ම ශ්‍රී ලංකාවේ පැවතුණු කොන්දේසි දිගුකාලීන ආයුධ සන්නද්ධ ව්‍යාපාරයකට අවාසිදායක විය. එනම් විජේවීර කියූ ජනප්‍රිය ප්‍රකාශයක් වූයේ කොස් ගස විප්ලවයට ප්‍රධාන බාධකය බවයි. එමගින් ඔහු කියන්නට උත්සහ කළේ ගැමිගොවියා පවතින මර්දනකාරී කොන්දේසිවලට එරෙහිව අරගල කරනවා වෙනුවට විවිධ ක්‍රම මගින් නොමැරී බේරීමට උත්සහ කරන බවයි.

රුසියානු, චීන සහ කියුබානු මොඩලයන් ලංකා සන්දර්භයට ආදේශ කිරීමේ පවතින නොහැකියාවන් පිළිබඳ අවබෝධය නිසා විජේවීර වෙනත් විප්ලවීය මාදිලීන් පිළිබඳව සලකා බැලුවේ ය. එහිදී ඔහුට මොස්කව්හි ලුමුම්බා සරසවියේ සගයෙකු වූ අබෙයිඩ් කරුමෙ තීරණාත්මක විය. කරුමෙ හරහා විජේවීර 'එක් දින විප්ලවය' පිළිබඳ අදහස ලබා ගත් අතර කරුමෙ මෙම අදහස 1964 දී ඉතා සාර්ථකව ක්‍රියාවට නංවා සැන්සිබාරයේ ජනාධිපති බවට පත්විය. මෙමගින් උද්දාමයට පත් විජේවීර ජවිපෙ සංවිධානය කළේ එක් දින ආයුධ සන්නද්ධ අරගලයක් හරහා රාජ්‍ය බලය ලබා ගැනීමට ය. ඉහත සඳහන් කළ ජවිපෙ දෘඪ සංවිධාන ආකෘතිය නිර්මාණය කරන ලද්දේ විප්ලවීය අරමුණක් ඉටු කර ගැනීම වෙනුවෙනි.

මෙවැනි සංකීර්ණ ව්‍යුහයකට ඊටම අනන්‍ය වූ සීමාකම් තිබිණි. එහිදී වඩා වැදගත් කාරණාව වූයේ එමගින් තීරණ ගැනීමේ ප්‍රජාතන්ත්‍රවාදය සීමාවීම ය. විශේෂයෙන් කණ්ඩායම් දෙකක් තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් බැහැර කරන ලදි. එනම් දේශපාලන මණ්ඩලයෙන් සහ මධ්‍යම කාරක සභාවෙන් පහළ සිටි සාමාජිකත්වයට තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපෑම් කරන්නට තිබූ හැකියාව ඉතාම අවම විය. එනම් සාමාජිකත්වයෙන් බලාපොරොත්තු වූයේ නායකත්වය ප්‍රශ්න කිරීමකින් තොරව නියෝග පිළිපැදීමයි. චන්ද්‍රාට අනුව 'අපි ඉන්නේ ඉහළින් ආපු තීරණත් එක්කනේ. හැබැයි ඒ දවස්වල ඒක තේරුනේ නෑ. ඒ දවස්වල අපි හිතුවේ ඒ කියන දේවල් හරියි කියලනේ'. තීරණ ප්‍රශ්න කිරීම එම කෙනාට නිශේධාත්මක අනන්‍යතාවක් දෙන ලදි. නමුත් එක් දිනක් තුළ රාජ්‍ය බලය ලබා ගැනීමට හැකිය යන අරමුණ මෙම දෘඪ මධ්‍යගතකරණය සාධාරනීකරණය කෙරීය. වෙනත් විදියකට කියනවා නම් මෙම අවසාන අරමුණ ප්‍රජාතන්ත්‍රවාදී

අවකාශයක් තුළ සාක්ෂාත් කරගත නොහැක. එයට අවශ්‍ය වූයේ ඍජු තීරණ ඉක්මණින් ගත හැකි සහ සමස්ත සාමාජිකත්වය එක මිටකට ගත හැකි ශක්තිමත් මධ්‍යගත පාලනයකි. මන්ද එක් වැරදි අඩියක් රාජ්‍ය බලය ගැනීමේ සමස්ත ක්‍රියාවලියම අඩපණ කළ හැකි බැවිනි.

දැනුවත්ව හෝ නොදැනුවත්ව තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් ඉවත් කරන ලද අනෙක් කණ්ඩායම වූයේ ස්ත්‍රීන් ය. දේශපාලන මණ්ඩලයේ හෝ මධ්‍යම කාරක සභාවේ එකදු හෝ ස්ත්‍රියක් නොසිටියා ය. කාන්තා අංශය මෑතකදී ස්ථාපිත කළ ද එහි නායකත්වය ගත්තේ පිරිමියෙකි. නිමල් මහරගේට අනුව නායකත්ව මඬුල්ලේ ස්ත්‍රීන් නොසිටීමට මූලික හේතුව වූයේ ස්ත්‍රීන් ජවිපෙ දේශපාලනය කෙරෙහි ආකර්ෂණය වීමට කාලයක් ගතවීම බවයි: 'ඒක [ස්ත්‍රීන් දේශපාලන මණ්ඩලයේ සහ මධ්‍යම කාරක සභාවේ නොසිටීම] අපිට එච්චර තේරුණේ නෑ. ඒගොල්ලො එහෙම නොගතයුතුයි කියලා විශේෂ හේතුවක් තිබුණේ නෑ. නමුත් ඒ ගොල්ලො සම්බන්ධ වුණේ පස්සෙනේ, 69 වගේ කාලෙනේ. මේවා [ව්‍යුහයන්] තිබ්බේ 65 විතර කාලේ ඉඳන්නේ'. ස්ත්‍රීන් නායකත්ව මණ්ඩලයෙන් බැහැරවීම පිළිබඳව චන්ද්‍රාට තියෙන්නේ ද මීට සමාන අදහසකි: 'දැන් අපි වෙනස් වෙලා හිටියේ සහ අපි වෙනස්වෙලා වගේම අනිත් අයත් වෙනස් වෙන්න ඕනේ කියන මතේ තමයි අපි හිටියේ. ඒක ඇත්තටම සිද්ධ වුණා මදියි කියන එකයි මම කියන්නේ. සමහර විදියට අපි මේ විදියට තව අවුරුදු 5ක් විතර ගියා නම්, සමහර විට අපිට කාන්තාව තව ගොඩක් සම්බන්ධ කර ගන්න තිබුණා'.

ස්ත්‍රියව බැහැරකිරීම ජවිපෙ දේශපාලනයට පමණක් අනන්‍ය වූ දෙයක් නොවේ. මෙය ස්ත්‍රිය සම්බන්ධයෙන් ලංකාවේ පැවති සාමාන්‍ය තත්වය විය. අගමැතිවරියක සහ ජනාධිපතිවරියක පත් වුව ද අද පවා ස්ත්‍රිය සම්බන්ධයෙන් මෙම තත්වය වෙනස්වී නැති බව කිව හැක. එනම් 'ස්ත්‍රියගේ සාම්ප්‍රදායික අදේශපාලනික භූමිකාව ළමා කාලය තුළ දැරියන් සමාජගතකරණ ක්‍රියාවලිය තුළදීම දැකිය හැකි අතරත්, ඔවුන්ගේ භූමිකාවන් සහ අපේක්ෂාවන් පෞද්ගලික පරිමණ්ඩලයට සීමා කරන අතරත්, දේශපාලනය අයත් වන මහජන පරිමණ්ඩලය පවරා ඇත්තේ පිරිමින්ට ය' (කර්නී 1981: 729).

පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකාව පුරාවට ස්ත්‍රීන් දේශපාලනය තුළ බැහැරකර ඇත. මෙයින් අදහස් වන්නේ ස්ත්‍රිය දේශපාලනය තුළ නිශ්ක්‍රීය බව නොවේ. ස්වර්ණා ජයවීර පෙන්වා දෙන ආකාරයට 'ස්ත්‍රීන් ප්‍රධාන පක්ෂවල සාමාජිකත්වයෙන්

හතරෙන් එකක් සහ තුනෙන් එකක් අතර ප්‍රමාණයක් වන අතර දේශපාලන මණ්ඩල සභිකයින් සිටින්නේ ඉතාම සුළු ප්‍රමාණයකි' (කර්නී 1981: 732). 1969දී එක්සත් ජාතික පක්ෂයේ නිලධාරීන් 13 දෙනා අතරින් කාන්තාවන් සිටියේ එක් අයකු වන අතර ක්‍රියාකාරී කමිටු (working committee) සාමාජිකයින් 51 දෙනා අතරින් කාන්තාවන් සිටියේ දෙදෙනෙකි. 1970දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටි නිලධාරීන් 16 දෙනා අතරින් කාන්තාවන් සිටියේ දෙදෙනෙකු අතර ඔවුන්ගෙන් අයෙක් පක්ෂ නායිකාව විය. 1972දී ලංකා සමසමාජ පක්ෂයේ 55 දෙනෙකුගෙන් සමන්විත මධ්‍යම කාරක සභාවේ කාන්තාවන් සිටියේ එක් අයෙකු අතර දහදෙනෙකුගෙන් යුත් දේශපාලන මණ්ඩලයේ කිසිදු කාන්තාවක් නොසිටියා ය (කර්නී 1981: 732). කෙසේ නමුත් ලෝකයේ පළමු අගමැතිනිය ලෙස තේරී පත්වූ සිරිමා බණ්ඩාරනායක වැනි කාන්තාවන් කිහිපදෙනෙකු දේශපාලනය තුළ සාර්ථක වී ඇත. 1970 පාර්ලිමේන්තු මැතිවරණයේදී අපේක්ෂකයින් 441ක් තරඟ කළ අතර ඔවුන්ගෙන් 14 කාන්තාවන් විය. ඔවුන්ගෙන් 6 දෙනෙකු 151 දෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තුවට තේරී පත් වී තිබුණි (කර්නී 1981: 734). ප්‍රභූවාදය සහ පීතෘමූලික ප්‍රතිමාන මෙම කාන්තාවන් බොහෝ දෙනෙකුගේ දේශපාලන ගමන තීරණය කරන ලදි. '1947 සිට පත් වූ කාන්තාවන් 17 දෙනාගෙන් භාගයකට වැඩි පිරිසක් පාර්ලිමේන්තුවට තේරී පත් වූයේ මිය ගිය හෝ නීතිමය කාරණා නිසා තරඟ කිරීමට නොහැකි වූ ස්වාමිපුරුෂයින්ගේ හෝ පියවරුන්ගේ හිස්තැන් පිරවීමටය' (කර්නී 1981: 737). සිරිමා බණ්ඩාරනායකගේ සිද්ධියේදී ඇය 1965 වන තෙක් පාර්ලිමේන්තු අසුනකට තරඟ නොකළා ය. ඇය දේශපාලනයට පැමිණියේ ඇයගේ ස්වාමිපුරුෂයා වූ අගමැති එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායකගේ ඝාතනයත් සමග සෙනෙට් මණ්ඩලයට ඇතුළත් වීම හරහා ය. ඒ තුළින් ඇයට අගමැති තනතුරේ කටයුතු කිරීමට හැකියාව ලැබිණි.

## ස්ත්‍රිය සහ සමානාත්මතාව

'අපි හැම තිස්සෙම කරන්නේ අනිත් අය [පිරිමි අය] කියපු දේනේ. අපි තීරණ ගත්තා අඩුයිනේ' යැයි චන්ද්‍රා පැවසුවා ය. අපට නිරීක්ෂණය කළ හැකි දෙය වන්නේ ප්‍රධාන ධාරාවේ දේශපාලනය ස්ත්‍රීපුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් අන්ධ බව ය. සමහරවිට අපට අනෙක් දේශපාලන පක්ෂ මෙහිදී අමතක කළ හැකිය. ඒ මක්නිසාද යත් ඒවා ඍජුවම හෝ වක්‍රව ධනවාදී දේශපාලන ක්‍රමයට

අනුගත ඒවා බැවිනි. නමුත් ජවිපෙ නිර්මාණය කරනු ලැබුයේ ඔවුන්ගේ පූර්වජයන්ට නොහැකි වූ අරමුණක් ඉෂ්ට කර ගැනීමට ය. එනම් සමානයින්ගේ සමාජයක් නිර්මාණය කිරීම ය. එම අරමුණත් සමග ජවිපෙ කෙසේ ද පිරිමින්ට වඩා පහත් මට්ටමකින් ස්ත්‍රීන්ට සැලකුවේ?

මෙය ජවිපෙ දේශපාලනයට පමණක් නොව සමස්ත විප්ලවීය දේශපාලනයට අදාළව ගත් විට පොදු තත්වයකි. වෙනත් ආකාරයකට කියනවා නම් විප්ලවකාරී දේශපාලන ව්‍යාපාරවල අරමුණ සමානයින්ගේ සමාජයක් වූවත් ඒවට පවතින ස්ත්‍රීපුරුෂ සමාජභාවි ප්‍රතිමානයන්ගෙන් වියුක්ත වීමට හැකියාවක් ලැබී නැත. කොටින්ම කියනවා නම් 20 වන සියවසේ සිටි ශ්‍රේෂ්ට විප්ලවවාදියෙකු සහ 1971 කැරැල්ලේ සුරුවමක් වූ චේ ගුවේරාටත් මෙය පොදු ය. සිය *Guerilla Warfare* නම් කෘතියේ ගරිල්ලා ව්‍යාපාරයක ස්ත්‍රියකගේ භූමිකාව විස්තර කරන කොටස තුළ චේ සාම්ප්‍රදායික පුරුෂාධිපති ප්‍රතිමාන පුනරුච්චාරණය කරයි.

> මෙම [ගරිල්ලා අරගලය] තුළ ස්ත්‍රියට සාමය පවතින කාලයේ කරන සාම්ප්‍රදායික භූමිකාව රගදැක්විය හැකඃ ගරිල්ලා යුද්ධයේ අන්තිම අසිරු කොන්දේසි යටතේ ජීවත් වන කැරලිකරුවෙකුට මොනයම් හෝ රසයක් ඇති කෑමක් භුක්ති විදීමට ලැබීම සතුටට කරුණකි. ස්ත්‍රී කෝකියකුට කෑම රසවත්ව ඉවිය හැකි අතර වඩා පහසුවෙන් භාර දී ඇති මෙම ගෘහස්ථ කටයුතු සිදු කළ හැක... අනන්ත වූ කරුණාවක් ආයුධ අත ගත් සිය රළු සගයාට මුදා හරිමින් හෙදියක ලෙස හෝ වෛද්‍යවරියක ලෙස ක්‍රියාකිරීමට ස්ත්‍රියට පුළුවන. එවැනි ශ්‍රේෂ්ටත්වයක් අසරණ, සැපයක් නැති, සමහර විට දැඩි වේදනාවෙන් පෙළෙන සහ යුද්ධයේ ස්වභාවයේ අංගයක් වන දැඩි අවදානමකට නිරතුරුව මුහුණ දෙන කැරලිකරුවාට විශාල සහනයකි (ගුවේරා 2006ඃ 107-108)

චේ මිලිටරි ව්‍යාපාරවලින් කාන්තාව ආන්තිකරණය කිරීමට උත්සහ නොකළ ද ඉහත කොටසෙන් දැක්වෙන ආකාරයට ඔහු ද සාම්ප්‍රදායික පුරුෂාධිපති ප්‍රතිමාන වූ ස්ත්‍රීන් මිලිටරි ව්‍යාපාර තුළ වඩා වැදගත් වන්නේ ඔවුන් ගෘහය තුළ කරන භූමිකාවට සමාන භූමිකාවක් රඟදක්වනු ඇතැයි බලාපොරොත්තු විය. කියුබාව, කොලොම්බියාව, උරුගුවේ, නිකරාගුවා සහ එල් සැල්වදෝර් යන ලතින් ඇමරිකානු රටවල් පහේ මිලිටරි ව්‍යාපාරවල ස්ත්‍රියගේ සමාජ මට්ටමේ සිදු වූ ක්‍රමික වර්ධනය පිළිබඳව පුළුල් විස්තරයක් ලින්ඩා එල්. රීෆ් (1986) ලබා දෙන්නී

ය. සමහර අවස්ථාවලදී ස්ත්‍රීන්ගේ මෙම ද්විතියික භූමිකාව ඔවුන් විප්ලවීය ව්‍යාපාර තුළ ලිංගික සූරාකෑම්වලට ගොදුරු වීමට හේතුවක් වී ඇත. නැක්සල් ව්‍යාපාරය තුළ 'බොහෝ අවස්ථාවලදී කැරලිකරුන්ට ලිංගික සේවා සැපයීම කැරලිකාරිනියන්ගේ රාජකාරියක් ලෙස නැක්සල් නායකයින් විසින් නියෝග කර ඇත' (ශෙබාවත් සහ සක්සෙනා 2015: 125). මෙම රාජකාරිය ප්‍රතික්ෂේප කිරීම නිසා දූෂණයට ලක්වීමේ අවදානමක් ඇති බැවින් බොහෝ කැරලිකාරිනියන් කැරලිකරුවන්ගේ ලිංගික ආශාවන් සන්තර්පනය කිරීමට එකඟ වීමට සිදු වී තිබේ (ශෙබාවත් සහ සක්සෙනා 2015: 125). නැක්සල් කැරලිකරුවකුගේ පහත දක්වා ඇති ප්‍රකාශය ස්ත්‍රියට අඩු සැලකිලි හිමිවීම පිටුපස ඇති පිතෘමූලික චින්තනය ලසු කොට දක්වයි: 'ගෑනු අපිත් එක්ක එකට සටන් කරනවා... අපි හැම වගකීමක්ම බෙදා ගෙන තියෙන්නේ... ඒත් සමහර සංස්කෘතික ප්‍රතිමාන තියෙනවා. කැරලිකාරිනියොත් ඇතුළු ගෑනු ඒවට එකඟ වෙනවා නම් ඒක එයාලටත් හොඳයි, සමස්තයක් ලෙස සමාජයටත් හොදයි. ගෑනුන්ට යහපත වෙනුවෙන් පිරිමින් එක්ක එකතු වෙලා සටන් කරන්න පුළුවං. හැබැයි ඒකෙන් එයාලට නිදහස හම්බවෙන්නේ නෑ එයාලට දීලා තියෙන සීමාවෙන් එළියට ගිහින් වැඩ කරන්න' (ශෙබාවත් සහ සක්සෙනා 2015: 126).

මෙම සන්දර්භය තුළ දැවෙන ප්‍රශ්නයක් වන්නේ සමානාත්මතා සමාජයක් පොරොන්දු වෙන විප්ලවීය ව්‍යාපාරයකට ස්ත්‍රීන්ට සමානයින් ලෙස සැලකීමට නොහැක්කේ මන්ද යන්නයි. අතීතය ආවර්ජනය කිරීමෙන් අපට කිව හැක්කේ මධ්‍යම පාංතික ගොවිගම කාන්තාවක් වන චන්ද්‍රා ජවිපෙ වෙත ආකර්ෂණය වීම සහ පූර්ණකාලීනයකු ලෙස එයට සම්බන්ධ වීම හරහා මෙම විරුද්ධාභාසය විසඳාගෙන තිබූ බවයි. එම නිසා චන්ද්‍රාගේ අත්දැකීම් මොන ආකාරයට අපට සමානාත්මතා සමාජය පිළිබඳ පොරොන්දුව සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී අසමානතාව යන විරුද්ධාභාසය තෙරුම් ගැනීමට ආලෝකයක් සපයයි ද? 'මහා සමාජය ඇතුළේ ලොකු අසමානතාවක් තියෙනවා. ඒක පංතිය ද ස්ත්‍රීපුරුෂභාවය ද කුලය ද ආදි වශයෙන් තියෙනවා. හැබැයි සාමාන්‍ය මනුස්සයෙක් ජවිපෙ ඇතුළට ගියාම ඒ අසමානතාවය තිබුනේ නැද්ද? ' යන ප්‍රශ්නයට ඇය දුන් පිළිතුර මෙම විරුද්ධාභාසය තේරුම් ගැනීමට අපට මගක් ලබා දේ. ඇගේ පිළිතුර වූයේ 'නෑ [අසමානතාව] එහෙම තදට තිබුනේ නෑ. තදට තිබුනේ නෑ කියන්නේ මම අර කිව්වා වගේ *තීරණ ගැනීමෙදී වගේ දේවල්වලදී මිසක් පැවැත්මෙදී එහෙම ගැටළුවක් තිබුණේ නෑ*' (අවධාරණය මගේ). අප දැනටමත් විවිධ කණ්ඩායම්

තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී බැහැරකිරීම පිටුපස තිබූ තර්කනය පිළිබඳව සාකච්ඡා කොට ඇත. එසේනම්, තීරණ ගැනීමේදී තිබෙන අසමානතාව පැවැත්ම විසින් නිශ්ප්‍රභ කරනු ලබන්නේ කෙසේ ද?

'තීරණ ගැනීමේදී වගේ දේවල්වලදී මිසක් පැවැත්මේදී එහෙම ගැටළුවක් තිබුණේ නෑ' යන්නෙන් ඇය අවධාරණය කරනුයේ ස්ත්‍රීපුරුෂභාවය, පංතිය හෝ කුලය යන කාරණා නොතකමින් අනෙක් අයත් සමග සමානයකු ලෙස හැසිරීමට ඇයට ඉඩ ලැබුණු බවයි. එනම් ඇය ඇගේ සහෝදර කැරලිකරුවන් හා සමානයෙක් ලෙස සිටියා ය. ස්ත්‍රී නායිකාවක ලෙස ඇය අයත් වූයේ ජවිපෙ නායකත්ව ස්ථරායනයේ දෙවන පෙළ ස්ථරයට වන අතර පළමු ස්ථරය වූයේ අප ඉහතින් සාකච්ඡා කළ ආකාරයට දේශපාලන මණ්ඩලය සහ මධ්‍යම කාරක සභාවයි. පළමු ස්ථරය සමග ඇයට තිබූ සබඳතාව ඉතාම අවම වූ නිසා ඇගේ පැවැත්මට අදාළ ස්ථරය වූයේ අනෙක් සාමාජික ස්ථරායනයයි. අපි මොහොතකට එඬේරමුල්ල අධ්‍යාපන කඳවුර පිළිබඳ ඇගේ අත්දැකීමට සවන් දෙමු.

> එකක් තමයි නැවත නැවත අරගල ගැන කතා කරනවා. පංති කරනවා වගේ දිගටම ඒවා ගැන කතා කරනවා. කෑම කනවා. ඊට පස්සේ ආයුධ පුහුණුව තමයි ගොඩක් කළේ. ඊට පස්සේ රෑට නිදා ගන්නවා... එඬේරමුල්ලෙදී කෑම හදන වැඩ කට්ටිය එකතු වෙලා කළා. හැබැයි ගොඩක් හිටියේ ගෑනු අය හින්දා එයාලා තමයි ගොඩක් වෙලාවට ඒක කළේ. හැබැයි පිරිමි අයත් උදව්වුණා. එහෙම නොකරනවමත් නෙමෙයි ඉතිං. ඒ කඳවුරුජීවිතේදී ගෑනුන්ගේ වැඩ මෙහෙමයි පිරිමින්ගේ වැඩ මෙහෙමයි කියලා එහෙම එකක් තිබ්බේ නෑ. හැම දේම කණ්ඩායම්වලට බෙදිලා තමයි කරේ. ඒකෙදී ගෑනුපිරිමි භේදයක් තිබුනේ නෑ. ඒවගේ දේවල්වලදී නම් බොහෝදුරට සමානකම තිබුණා.
>
> ඒවල පංති කරන කොට කට්ටිය බිම තමයි වාඩි වුණේ. උගන්නන කෙනා ගොඩක් වෙලාවට ඉඳගෙනත් හිටියා. මොකද ඇත්තටම පැය 10ක් 12ක් කරන කොට ඉතිං අමාරුයිනේ. දෙගොල්ලොම බිම ඉඳගෙන. මොකද දන්නවද හේතුව? ඇත්තටම අපි යන තැන්වල පහසුකම් එහෙම තිබුණා අඩුයි. මොරගහහේනේ උඩ තට්ටුවක අපි කළේ. රහස් රැකෙන්නත් එපැයි. එහෙම තමයි මේවා කළේ. ඒවයෙදි නම් එහෙම ලොකු වෙනස් කම් තිබුනේ නෑ. අනික වාඩි වෙන කොට

> ගෑනු පිරිමි කලවමේ වාඩි වුණේ. එකට ඉඳීම කොහොමත් තිබුණා. නිදා ගන්නකොටත් අපි එකට තමයි නිදා ගත්තේ. එක දිගට. ඒක ගානක් තිබ්බේ නෑ. එක හෝල් එකේ දෙපැත්තේ නිදා ගත්තේ.

රොන්සියෙර්ට අනුව සමානාත්මතාව 'සියලු දෙනාම සමානයි යන පූර්වකල්පනය සහ එය සත්‍යාක්ෂණය කිරීමට උත්සහ කිරීම උපදේශ කරගත් භාවිතාවන්ගේ ගොණුවකින්' (රොන්සියෙර් 1992: 58) සමන්විත වේ. රොන්සියෙර් සමානාත්මතාව යනු අනාගතයේ ළඟා කරගත යුතු දෙයක් හෝ අරමුණක් ලෙස හෝ නොසලකයි. ඔහුට අනුව එය තීරණය වන්නේ මේ වර්තමාන මොහොතේදී ඔබ අනෙක් අය සමග සබඳතා පවත්වා ගන්නේ කෙසේ ද යන්න මතයි. සමානාත්මතාව පුහුණු කිරීමම යන්නයි අපට ඇත්ත වශයෙන්ම සමානාත්මතාව වන්නේ. ඉහත දැක්වූ ආකාරයට චන්ද්‍රා සමානයින් අතර ගැවසුනා ය. කිසිවෙකුත් ඔවුන්ගේ ස්ත්‍රීපුරුෂභාවය, කුලය, පංතිය හෝ වෙනත් කාරණාවක් නිසා හෝ විශේෂ සැලකිල්ලක් හෝ වැරදියට සැලකීමක් ලැබුවේ නැත. ඒ අනුව බලන කල එඬේරමුල්ලට පැමිණි කාණ්ඩය කඳවුර තුළ ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතුවලදී සියලු දෙනාම සමානයෝ ය යන පූර්වකල්පනය සත්‍යාක්ෂණය කිරීම හරහා සමානාත්මතාව භාවිතයේ තබා ගන්නා ලදි.

1971 පිළිබඳව සිය මතකය අවධි කළ ශිෂ්‍ය අංශයේ නායකයකු වූ සුනිල් රත්නසිරි සහ කළුතර දිස්ත්‍රික් ලේකම් වූ නයනානන්ද[8] චන්ද්‍රාගේ මේ අත්දැකීම තහවුරු කරති. තරුණයින් ලෙස ස්ත්‍රීන්ට අසමාන සැලකීමක් තිබූ බවට හැඟීමක් ඔවුන්ට නොතිබූ බවට ඔවුහු ප්‍රකාශ කර සිටියෝ ය. රත්නසිරිට අනුව:

> වැඩ පවරන කොට එයා ගෑනු ද පිරිමි ද කියලා බැලුවේ නෑ... [ගෑනු අයට කියලා] එහෙම විශේෂ වැඩක් තිබ්බෙත් නෑ. අපේ මොකක්හරි විශේෂ රුස්වීමක් හරි පෙළපාලියක් හරි තිබ්බොත් ඒ ගොල්ලො අවශ්‍යවුනොත් ගේන්න කියනවා. වැඩ තමයි ආයුධ එකතු කරන්න, තොරතුරු ගෙනියන්න, සාමාජිකයො බඳවා ගන්න වගේ පොදුවේ තිබ්බ වැඩ ඇතුළේ ඒ ගොල්ලො ඒ ඔක්කොම කළා.

[8] නයනානන්ද සමග 2019 ජූනි 18 දින අම්බලන්ගොඩ පිහිටි ඔහුගේ නිවසේදී කරන ලද සම්මුඛ සාකච්ඡාව ඇසුරෙන්.

මෙය නයනානන්ද ද තහවුරු කරයි: 'කඳවුරුවලදී එහෙම වෙනස් දේවල් තිබ්බේ නෑ. ඒවලදී ගොඩක් ආවේ කොල්ලෝ. කෙල්ලො සම්බන්ධ වුණත් ඒයාලට උයන්න පිහන්න කියලා වෙනමම කාර්ය තිබ්බේ නෑ. හැමෝම දේවල් එකට කළා'. මෙම අත්දැකීම් අපට පෙන්නන්නේ වෙනස් ලෝකයකි. එනම් ස්ත්‍රියට සහ පිරිමියාට කියා නිශ්චිත ස්ථානයක් සහ භූමිකාවක් නොතිබූ ලෝකයකි.

කෙසේනමුත් ජවිපෙ ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව තිබූ දේශපාලන පක්ෂයක් ලෙස ලේබල් කිරීම නොමගයවනසුළු දෙයකි. නමුත් නයනානන්ද සහ රත්නසිරි ව්‍යාපාරය තුළ ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව පිළිබඳව ධනාත්මකව කතා කළ අතර පෙනෙන විදියට සමාජය තුළ ස්ත්‍රීන්ට තිබූ භූමිකාවන් පිළිබඳව ඔවුන් එතරම් තැකීමක් කළ බවක් සම්මුඛ සාකච්ඡා තුළ විද්‍යමාන නොවීය. නයනානන්ද විෂමලිංගික සබඳතා පිළිබඳව කළ විස්තරය ව්‍යාපාරය තුළ ස්ත්‍රිය පිළිබඳව තිබූ පොදු ආකල්පය විදහා දැක්වේ:

> දැන් අපිට ගර්ල් ෆ්‍රෙන්ඩ්ස්ලා කවුරුහරි ඉන්නව නම් ඒ අයව අනිවාර්යයෙන්ම මේකට ගන්න ඕනේ. නැත්තං අෆෙයාර් එක නවත්න ඕනේ [...] කාන්තාවන් ගැන ඒ කාලෙ තිබ්බ මතය තමයි කාටවත් මේ ලව් එෆෙයාර් එකක්වත් හදා ගන්න බෑ කියන එක. ලව් එෆෙයාර් එකක් තියෙනවා නම් ඉන්න එක්කෙනත් මේකට ගන්න වෙනවා. සනත් [බොරලුකැටිය]ට තිබ්බ ලොකු චෝදනාවක් තමයි එයා විවාහ වෙලා හිටියේ. එයාට ළමයි හම්බවෙන්නවත් තහනම් කරලා තිබුණේ.

ආදර සබඳතාවක් තිබීම විප්ලවවාදීන්ට සිය විප්ලවීය අරමුණ කර යාමට තිබූ බාධාවක් ලෙස මෙහිදී තේරුම් ගෙන තිබුණි. ව්‍යාපාරයේ සාමාජිකයන් නොවූ පෙම්වතියන් හෝ බිරියන් මෙම සන්දර්භය තුළ ජවිපෙ විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් මෙය පෙම්වතුන් සිටි කැරලිකාරිනියන්ට එතරම් තදින් අදාළ නොවීය. වෙන විදියකට කියනවා නම් කැරලිකාරිනියන්ගේ ආදර සබඳතා පාලනය කිරීමට දැඩි උත්සාහයක් නොවීය. එනම් මෙමගින් හඟවනුයේ අදේශපාලනික ස්ත්‍රියක අදේශපාලනික පිරිමියෙකුට වඩා බාධාවක් වන බවයි. මෙය වෙනත් ආකාරයකින් පවසන්නේ නම් සමාජය තුළ පවතින ස්ත්‍රීපුරුෂ සමාජභාවී ප්‍රතිමාන ව්‍යාපාරය තුළ ස්ත්‍රියගේ භූමිකාව කෙරෙහි බලපෑමක් කරන බවයි.

නිමල් මහරගේ සමග කළ සම්මුඛ සාකච්ඡාවේදී ඔහු ස්ත්‍රීන්ට වෙනස් ආකාරයේ සැලකිල්ලකට ලක් වූ අවස්ථා දෙකක් පිළිබඳව සදහන් කරයි. එක් අවස්ථාවක පොලිස් කමිටුවක සාමාජිකයෙක් සාමාජිකාවක විසින් තුවක්කු දෙකක් පිළිබඳව දෙන ලද තොරතුරු නොසලකා හැරියේ ය. ඇය ඈ වාසය කළ නිවසේ තිබූ තුවක්කු දෙකක් සොරා ගෙන මිටි බැඳ අදාළ සාමාජිකයාට පැමිණ රුගෙන යන ලෙස දැන්වූවත් එම තරුණියගේ ආත්මශක්තිය සහ විශ්වසනීයත්වය සැක කළ ඔහු එය මග හැරියේ ය. තුවක්කු එකතු කිරීම ඔවුන්ගේ ප්‍රධාන කාර්යයක් වූ අතර එවැන්නක් පිළිබඳව ලැබුණු තොරතුරු නොසලකා හැරීම බරපතල ප්‍රශ්නයක් විය. අනෙක් අවස්ථාව වූයේ සාමාජිකාවක විසින් අඳින ලද පනාගොඩ හමුදා කඳවුරේ සිතියම පනාගොඩ පොලිස් කමිටුව විසින් ප්‍රතික්ෂේප කිරීමයි. මෙයට මූලික හේතුව වූයේ ඇගේ සිතියම්ගත කිරීමේ හැකියාව පිළිබඳව තිබූ ඊර්ෂ්‍යාවයි. ඇය ඇඳි සිතියම සහ පොලිස් කමිටුව විසින් ලබා දුන් සිතියම සසඳා බැලීමේදී සාමාජිකාව විසින් ඇඳි සිතියම වඩා නිරවද්‍යබව තහවුරු විය. මේ නිසා මහරගේ පනාගොඩ හමුදා කඳවුරට පහරදීමට යොදා ගත්තේ සාමාජිකාවගේ සිතියමයි. මේ අනුව මහරගේගේ අත්දැකීම්වලට අනුව ව්‍යාපාරය තුළ පුරුෂාධිපත්‍ය ප්‍රතිමානයන්ගේ බලපෑම දක්නට ලැබුණි. නමුත් ඉහත කී අවස්ථා දෙකේදීම එම ස්ත්‍රීන්ගේ ශ්‍රමය ඇගයෙන ආකාරයේ තිරණයන් ගැනීමට ඔහු කටයුතු කළේ ය. එවැනි තීරණයන් හරහා ඔහු ස්ත්‍රීන්ට තිබූ අඩු සැලකිල්ල වෙනස් කිරීමට කටයුතු කිරීම තුළ සමානාත්මතාව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ඔහු තුළ තිබූ නැඹුරුව පෙනී යයි.

මෙවැනි සීමාකම් තිබුණ ද ශෙබාවත් සහ සක්සෙනා (2015) නැක්සලයිට් ව්‍යාපාරයේ විස්තර කරනු ලැබූ ලිංගික සූරාකෑම වැනි සිදුවීම් 1971 කැරැල්ල තුළ දක්නට නොවීය. සිය පිරිමි සගයන් තමන්ට සැලකූ ආකාරය පිළිබඳව කතා කරන විට චන්ද්‍රා ඉතා ප්‍රමෝදයට පත්වේ. ඇය පිරිමි සගයන් සමග අධ්‍යාපන කඳවුරුවල රාත්‍රිය ගත කළ ද කිසිවිටෙක එවැනි හිංසනයකට ලක් නොවූවා ය. ඇය සඳහන් කළ පරිදි ඔවුන් දැඩි ලෙස විනයගරුක විය. ඇයට අනුව එය සහෝදරත්වය විය. මෙම වචනය මාක්ස්වාදී වචනයක් වන කැමරාඩරී (camaraderie) යන වචනයට ලබාදුන් සිංහල අර්ථදැක්වීමයි. ශ්‍රී ලංකා (සහ පොදුවේ සමස්ත දකුණු ආසියානු) සන්දර්භවල පුරුෂාධිපත්‍යය මගින් වගකීම් බෙදා හැරීම තුළ සහෝදරයින් සිය සහෝදරියන්ගේ සුබවිහරණය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

ස්ත්‍රියක ලෙස චන්ද්‍රා කිසිවිටෙකත් සිය ස්ත්‍රීත්වය ඇගේ දේශපාලන ක්‍රියාකාරකම්වලට බාධාවක් කර නොගත්තා ය. ඇය පිරිමි සගයන් හා සමානවම ධෛර්යය සහ ආත්ම ශක්තිය පෙන්නුවා ය. මෙය පැහැදිලිවන්නේ ඇයව කැරැල්ලේ පරාජයෙන් දින කිහිපයකට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූ අවස්ථාවේදී ය. ඒ කැරලිකාරිනියන්ට මුහුණ දීමට සිදු වූ අඳුරු කාලයකි. කතරගම රූප සුන්දරිය වුණු ප්‍රේමවතී මනම්පේරිව කැරැල්ලට සම්බන්ධයි කියා අත්අඩංගුවට ගෙන සමූහ දූෂණයට ලක් කොට කතරගම නගර මධ්‍යයේදී මහජනයා ඉදිරිපිට වෙඩි තබා ඝාතනය කර තිබුණි. සිය පියා සහ නැගණිය සමග 1971 අප්‍රේල් 4 දින නුවරට ගිය ගමන පිළිබඳව මතක් කරන විට අද පවා පද්මලතාගේ ඇගේ හිරිගඩු පිපේ.

> පොලිසියෙන් කිව්වා අපිට ගෙදරින් අයින් වෙන්න කියලා. අප්‍රේල් 4 වෙනිදා තාත්තා අපිවත් අරගෙන නුවර ගියා. අපි හරි අමාරුවෙන් ගියේ. ඒ දවස්වල බස් යන්නෙත් නැනේ. අපි ගෙදරින් පිට වුණාට පස්සේ තමයි ඔක්කොම වුණේ. පොලිසිවලින් මරලා දාලා. අපිව ටික දුරක් බස් එකේ ගිහින් බස් එකෙන් බස්සලා කියනවා ඕනේ එහෙක යන්න බස් එක යනවා කියලා ඩිපෝ එකට. හරිම බයෙන් අපි නුවරට යන්න පුළුවං වුණා, මොකද මිනිස්සු උදව් කළා. ගෙවල් දෙක තුනක නැවති නැවති ඔන්න අපි ගියා නුවර ගෙදරට. ඒ ගෙදර හිටියේ අම්මගේ යාලුවෙක් දෙමළ ලෙච්චමි නැන්දා කියලා. එයා අපිව දැක්කම බදා ගත්තා. ඊට පස්සේ පැය ගාණකින් ඇවිත් කිව්වා කෙල්ලො දෙන්නා අයින් කරන්න මොකද පොලිසියෙන් එනවා අපිව බලන්න කියලා. අපි එහෙම්ම කැලේ පැනලා හසලකට ගියා. හසලක අපේ අයියා කෙනෙක් ඉන්නවා. එහෙ ඉන්න කොට පොලිසිය රෑ ඇවිත් අපිව අරගෙන ගියා හසලක පොලිසියට. ඒවා මතක් වෙන කොටත් ඇග හිරිවැටෙනවා.
>
> ඉතිං මට ඕනේ මගේ නංගිව පරිස්සම් කර ගන්න. නංගි මගෙ ඇගේ එල්ලිලා. (නංගිගෙ වයස අවුරුදු 14ක් 15ක්, මට 20යි). නංගි හරි බයයි. එතනදි මම පිරිමියෙක් වගේ. උඹලා කරන දෙයක් මට කරන්න ඕනේ. දැන් මරනවා කියන්නේ දිගට හරහට මරනවා. මම කියන්නේ ඉස්සෙල්ලම මම මරලා ඕනේ මගේ නංගිව මරන්න. ඒ වගේ ශක්තියක් මට ආවා. මට ඒ දවස් වල වයස 20ක් වුණාට හිතින් පිරිමියෙක් වගේ. පවුලේ ලොක්කනේ.

වෙලාවට ඒ ඉන්ස්පෙක්ටර් අපි දන්න කෙනෙක්. ඒ වාසනාවෙන් අපි බේරුනා.

මෘදුව කතා කරන සහ ශරීරයෙන් කුඩා පද්මලතා එම අවස්ථාවේදී විශාල ධෛර්යයකින් සහ ආත්ම ශක්තියකින් හැසිරුනා ය. එපරිද්දෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවුම් ලැබූ විට චන්ද්‍රා ද එවැනිම වූ ආත්ම ශක්තියකින් සහ ධෛර්යයකින් හැසිරුනා ය. මෙවැනි අවස්ථාවක කාන්තාවක අඬති, බයබිරාන්ත වෙති හෝ කලබල වෙති යි කියා සාමාන්‍යයෙන් මිනිසුන් සිතුව ද චන්ද්‍රා එඩිතරව පොලිස් නිලධාරීන්ගේ ප්‍රශ්නවලට උත්තර සැපයුවා ය. ඇත්ත වශයෙන්ම පොලිස් ප්‍රශ්න කිරීම් හමුවේ කඩාගෙන වැටුණේ පිරිමි සගයන් මිස ඇය නොවේ.

පියතිලක එක දවසක් යෝක් ස්ට්‍රීට් බැංකුව කඩලා රුපියල් 50,000ක් මට බෑග් එකක දාලා ගෙනත් දීලා කිව්වා මේකේ බෝම්බ වගයක් තියෙනවා, තියන්න කියලා කිව්වම මම ඒක අරං තිබ්බා. ඇත්තටම මම ඒක කවදාවත් දිග ඇරියේ නෑ. වරින් වර එයා ඇවිල්ලා ඒක අරං ගියාට මම දන්නේ නෑ. සී අයි ඩී එකට ගෙනිහිල්ලා ඒකේ තිබ්බේ සල්ලියි කියලා කිව්වම තමයි මම දන්නේ. අපි අන්න එහෙම තමයි රහස් රැක ගෙන වැඩ කලේ [...]

එතකොට මම එනකොට මම මුකුත් හිතන් ආවේ නෑ. නමුත් ඇතුළට එනකොට කට්ටිය ඔක්කොම හිටියා. විද්‍යෝදයේ හිටපු හුඟක් කට්ටිය හිටියා. ඊට පස්සෙ මම හිතුවා මෙයාලා අහන එකටනෙ උත්තර දෙන්න ඕනේ කියලා. එතකොට මගෙන් ඇහුවේ 'මේ බෑග් එක මොකද්ද?' මම කිව්වා 'මම දන්නේ නෑ' කියලා. 'කවුද ගෙනල්ලා දුන්නේ' 'පියතිලක'. දැන් ඒ ගොල්ලො මෝඩයොනේ. එයාලා දිගින් දිගටම ඇහුවේ පියතිලකව දන්නේ කොහොම ද කියලා. එතකොට මම කිව්වා මට එයාව තුන් සැරයක් හම්බු වෙලා තියෙනවා කියලා. දැන් මම තුන් සැරෙත් ඔප්පු කරන්න එපැයි. එතකොට මම කිව්වා මම කැම්පස් යනවා කැම්පස් එකේදී යාළුවො කට්ටියත් එක්ක ඉඳිද්දි හම්බු වුණයි කියලා. ඊට පස්සේ ආපහු හම්බු වුණේ මොකට ද කියලා කිව්වම ආපහු හම්බු වෙච්ච විදිය කියන්න එපැයි. අපේ ගෙවල් පාර අයිනෙනේ. ඉතිං දෙවෙනි දවසේ ඔතනින් පියතිලක යද්දි හම්බු වෙලා කතා කරලා ගෙදරින් තේකක් බීල එහෙම ගියා කියලා. මම කිව්වා තුන් සැරයයි හම්බු වුණේ. තුන්වෙනි දවසේ ඕක ගෙනත්

දුන්නයි කියලා. දීලා තියා ගන්න කිව්වා මම තියා ගත්තා ඊට පස්සේ එයා ඒක ගෙනිච්චයි කියලා. දැන් මම මේ කියන දේවල් එයාලට බොරුයි කියලා ඔප්පු කරන්නත් බැනේ. මම ඉතිං බොරුව කියන්න එපැයි බොරුව විදියට. උන් මෝඩයි අපිට වැඩිය. අර කියපු ඔක්කොම බොරු ටික පිළිගත්තා. නිකං හිතන්න බැරි ද තව ටිකක් අහන්න බැරි ද 'ඇයි ඒ තරම්ම දෙයක් ඔයා භාර ගත්තේ ' කියලා. එහෙම ඇහුවේ නෑ [...]

මම එදා එතෙන්නට යන කොට අල්ලං හිටපු අය ඔක්කෝම මම දන්න අය. මම කාත් එක්කවත් කතා කරන්න ගියෙත් නෑ. ඒ ගොල්ලො කවුරුත් කිව්වෙත් නෑ. ඊට පස්සේ මේක අහලා අහලා කටඋත්තරේ ගත්තනේ. ගත්තට පස්සේ තියාගන්න ඕනේ නැනේ. ඉතිං මෝඩයෝ වගේ එව්වා.

සමහර විට මේ අපරාධ පරීක්ෂණ නිලධාරීන් සිතන්නට ඇත්තේ චන්ද්‍රා වැනි තරුණියක්ව බොහොම පහසුවෙන් මානසිකව බිඳවැට්ටවිය හැකිය කියා වන්නට පුලුවන. නමුත් අප දුටු පරිදි, මහත් විශ්වාසයකින් උත්තර දුන් ඈ සිය සගයන්ව පාවා දුන්නේ නැත. එමෙන්ම නිලධාරීන්ට ඇය කිසිවක් පාපොච්චාරණය කළෙත් නැත. අවාසනාවකට මෙවැන්නක් සැම දෙනාගෙන්ම බලාපොරොත්තු විය නොහැක. ඇය සමග ඉතා කිට්ටුවෙන් වැඩ කළ කැරලිකරුවකු ඇය සහ අනෙකුත් අය පිළිබඳව සියල්ලම හෙළි කෙරූ නිසා ඇය දින කිහිපයකින් අත්අඩංගුවට පත් විය. ඇය අත්අඩංගුවේ සිටින විට ඇය පළමු අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ නිලධාරීන් නොමග යැවීමට ඈ තුළ තිබූ නිර්භීතකම පිළිබඳව ඔවුන් තුළ ඈ පිළිබඳව තිබුණේ එක්තරා ගෞරවයකි. එක් අවස්ථාවක ඉහළ නිලධාරියකු මිත්‍ර ස්වරයකින් ඇයට පැවසුවේ 'තෝ නම් යකෝ අපේ කනෙන් රිංගුවනේ මොකක්වත් දන්නේ නෑ කියලා' යනුවෙනි. එමෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටියදී ඇය අනෙකුත් සගයන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් කටයුතු කළා ය. 'ඇත්තටම සී අයි ඩී එකට ගෙනිච්චේ ටික දෙනයි. මම ගොඩක් අය නවත්ත ගත්තා "දැන් ඕක තේරුමක් නෑ, පංති කරපු ළමයි ගෙනියන්න එපා. ඕන එකක් තියනවා නම් මගේ කටඋත්තරේ අනුව දාන්න" කියලා. එතකොට [ඉහළ නිලධාරියෙක්] කිව්වා "එහෙනම් තියෙන එක දාලා නිකමං ඉමු" කියලා. ඒගොල්ලන්ට [එක් කැරලිකාරයෙක්] දිග ලිස්ට් එකක් එහෙම දීලා තිබුණා'.

ඇයගේ ධෛර්යය සහ සහෝදර කැරලිකරුවන් කෙරෙහි තිබූ ආදරය එහි නිර්ව්‍යාජ ස්වරූපයෙන් විප්ලවයේ අඳුරු හෝරාව තුළ දැකගත හැකි විය. ඇය ව්‍යාපාරය සහ තමන් කෙරෙහි අනෙක් අයට තිබූ විශ්වාසය පාවා නොදුන්නා ය. ඒ හේතුව නිසාම අනෙකුත් කැරලිකාරිනියන් මීරිගම පිහිටි දේශපාලන සිරකරුවන්ගේ කඳවුරට ගියත් ඇයට වසර හයක් අපරාධකරුවන්ට වෙන්වූ වැලිකඩ සිරගෙදර සිරබත් කෑමට සිදුවුණි. සිරගෙදර ජීවිතය ජවිපෙ පිළිබඳ ස්වයංවිවේචනයක් කිරීමට අවශ්‍ය ඉඩ ඇයට ලබා දුණි. රාජ්‍ය බලය අල්ලා ගැනීමට සුදුසු සැලසුමක් ජවිපෙට නොතිබූ බව ඇයට අවබෝධ විය. 1977දී ඇයව නිදහස් කරන විට ඇය තවදුරටත් ජවිපෙ සාමාජිකාවක්ව නොසිටියා ය.

## සමාලෝචනය

චන්ද්‍රක්කාගේ කතාව විශ්ලේෂණය කිරීම බොහෝ හේතු නිසා වර්තමාන තරුණ ප්‍රජාවට වැදගත් වෙයි. ව්‍යාපාරය තුළ සහ එහි පරාජයෙන් පසු ඇය පෙන්වූ ධෛර්යය සහ කැපවීම වර්තමාන තරුණ පරම්පරාව තුළ එතරම් දක්නට නොලැබෙන ගුණාංගයන් ය. චන්ද්‍රක්කා ඉහළ කුලය, මධ්‍යම පාංතික සමාජ මට්ටම සහ ස්ත්‍රීත්වය විසින් අතුරන ලද බාධක බොහෝමයක් ජය ගැනීමට සමත් වූවා ය. මෙම සීමාකම් යටතේ ජීවත් වන සාම්ප්‍රදායික තාරුණ්‍යය අනුව නොගොස් පැවතුණු සමාජ පර්යායේ අවකාශය සහ කාලය ඛණ්ඩනය කරන්නාවූ විකල්ප ජීවිතයක් ඇයට තිබිණි. ඇයගේ මෙම වීර චාරිකාව කිසිවිටෙකත් පුළුල්ව ගවේෂණය කර නොතිබුණි. 1971 කැරැල්ල පිළිබඳ සාහිත්‍යයේ අධිපතීත්වය ගෙන තිබුණේ ව්‍යුහාත්මක සහ පුරුෂමූලික විශ්ලේෂණයන් ය. නමුත් චන්ද්‍රාගේ කතාව අපට කැරැල්ලේ වෙනත් පැතිකඩක් විවර කරයි. ඇය පෙන්වන්නේ පර්යේෂකයින් විසින් නොසලකා හැර ඇති ඇගේ භූමිකාව මොනතරම් වැදගත් ද යන්න ය. ඇය පෙන්වන්නේ මර්දනකාරී අවස්ථාවන්වලදී පිරිමින් හා සමානවම ධෛර්යයකින් යුතුව ස්ත්‍රිය ද කටයුතු කරන බවයි.

එමෙන්ම චන්ද්‍රාගේ කතාව අපට ජවිපෙ තුළ පැවැතුණු ස්ත්‍රීපුරුෂ සමාජභාවය විශ්ලේෂණය කිරීමට මෙන්ම එය ගෝලීය විප්ලවවාදී ව්‍යාපාර තුළ ස්ථානගත කිරීමට ද යොදා ගත හැක. විප්ලවවාදී ව්‍යාපාරවල පවතින විරුද්ධාභාසයක් අපි

මෙහිදී දුටිමු. එනම් ස්ත්‍රීන්ට පිරිමින් හා සමතැන් දෙන ගමන් සමානයින්ගේ සමාජයක් යන පොරොන්දුව මත සිට ගන්නේ කෙසේ ද යන්නයි. ලතින් ඇමරිකානු සහ ඉන්දියානු උදාහරණ අපට පෙන්වා දෙන්නේ මෙම පැතිකඩ දෙකම එකවිට සාක්ෂාත් කරගැනීමට තිබෙන අසීරුවයි. මෙහිදී සිදු වන්නේ සමානයින්ගේ සමාජයක් වෙනුවෙන් අරගල කරන ගමන් එම ව්‍යාපාරවල සිටින ස්ත්‍රීන්ට එහි පුරුෂමූලික නායකත්වය විසින් පිරිමියාට සාපේක්ෂව අඩු සැලකිලි දැක්වීම ය. පිටස්තරයකුට ජවිපෙ තුළ පැවතුණු ධූරාවලිය සහ ස්ත්‍රීන් තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් ආන්තිකරණය කර තිබීම පෙන්වා දෙමින් බොහොම පහසුවෙන් ජවිපෙ තුළ පවතින මෙම පුරුෂමූලික ස්වභාවය විවේචනය කළ හැක. නමුත් චන්ද්‍රා මේ සම්බන්ධයෙන් වෙනත් මානයක් අපට විවර කරන්නී ය. එනම් ව්‍යාපාරය තුළ වූ ඇගේ පැවැත්ම සම්බන්ධයෙන් ඇය අත්විඳි සමානත්මතාවයි. රහසිගත විප්ලවවාදී ව්‍යාපාරයකට අත්‍යවශ්‍ය තීරණ ගැනීමේ මධ්‍යගතබාවය කිසිවිටෙකත් ස්ත්‍රීන් සහ පිරිමින් සමානයින් ලෙස එකිනෙකා හා ගණුදෙනු කිරීමට බාධාවක් වූයේ නැත. වර්තමාන ජවිපෙ තුළ පවතින පුරුෂමූලික ස්වභාවය (වීරවර්ධන 2017) සැලකීමේදී ජවිපෙ 1971 පැවැතුණු ආකාරයේ ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවක් පශ්චාත් 1971 දේශපාලනය තුළ පවත්වා ගැනීමට හැකියාවක් ලැබුණා යැයි කීම දුෂ්කර ය.

ස්ත්‍රියකගේ කතාවක් ඇතුළත් මෙම පර්යේෂණය 1971 කැරැල්ල පිළිබඳව වෙනස් මානයක් ලබා දීමට උත්සහ කරයි. මෙය ජවිපෙ ඉතිහාසය තුළ නොසලකා හරිනු ලැබ ඇති මානයකි. කැරැල්ල පරාජයත් සමග බොහෝ කැරලිකාරිනියන් ජවිපෙ හැරගිය අතර එමගින් අද පවා දෘශ්‍යමාන වන ස්ත්‍රීපුරුෂ අසමානතාවයකට එය මග පෑදීය. එම නිසා පර්යේෂකයන්ට ජවිපෙ ස්ත්‍රීපුරුෂ සමාජභාවී කතිකාව පෝෂණය කිරීමට බොහෝ දේ කළ හැකි අතර එය ජවිපෙට පමණක් නොව ජාතික සහ ජාත්‍යන්තර පෙරටුගාමී දේශපාලන ව්‍යාපාරවලට මෙම සීමාකම අතික්‍රමණය කිරීමට රුකුලක් වනු ඇත. චන්ද්‍රක්කාගේ කතාව අපට දෙන පාඩම එයයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අයිවන්, වික්ටර්. **ශ්‍රී ලංකාවේ නූතන කැරලිකරුවන්ගේ සමාජ පසුබිම.** ගොඩගේ, 2006.

කුමාර, උදේනි සමන්. 2016. **71 අප්‍රේල් නඩු විභාගය: විජේවීරගේ හෘද සාක්ෂිය.** නියමුවා, 2016.

ජයතුංග, රුවන්. **71 කැරැල්ල: ආරම්භයේ සිට අවසානය දක්වා පූර්ණ සමාලෝචනයක්.** අගහස්, 2011.

ජයසිංහ, උපුල් ජනක. **ජේවීපී, විජේවීර සහ කල්‍යානන්ද.** කතෘ ප්‍රකාශන, 2019.

බණ්ඩාර, චමින්ද. **හැත්තෑ එකෙන් අසූ නමයට.** සරසවි, 2012.

Alles, A.C. (අලස්). *Insurgency 1971: An Account of the April Insurrection in Sri Lanka*. The Colombo Apothecaries' Co, 1979.

Castillo, Rosalva (කැස්ටිලෝ). ‘Between Hope and Adversity: The Struggle of Organized Women in Chiapas Since the Zapatista Uprising.’ *Journal of Latin American Anthropology* 3.1 (1997): 102-20.

Cooke, Michael Colin (කුක්). *The Lionel Bopage Story*. Trans. Upali Rathnayake. Surasa, 2019.

Custers, Peter (කස්ටර්ස්). ‘Women’s Role in Tebhaga Movement.’ *Economic and Political Weekly* 21.43 (1986): 97-104.

De Mel, Neloufer (ඩි මෙල්). *Women & the Nation’s Narrative: Gender and Nationalism in Twentieth Century Sri Lanka*. Rowman & Littlefield, 2001.

De Silva, Colvin R (ද සිල්වා). ‘April 1971 – A Foredoomed Ultra Leftist Adventure.’ *Selected Writings of Colvin R. De Silva 1935- 1989*, eds. Wesley S. Muthiah and Sydney Wanasinghe. Young Socialist Publications, 2007 (1971).

Donner, Henrike (ඩොනර්). ‘Radical Masculinity: Morality, Sociality and Relationships through Recollections of Naxalite Activists.’ *Dialectical Anthropology* 33.3&4 (2009): 327-43.

Garza, Anna María, and Sonia Toledo (ගාර්සියා සහ ටොලේඩෝ). ‘Women, Agrarian Movements, and Militancy: Chiapas in the 1980s.’ *Latin American Perspectives* 35.6 (2009): 63–76.

Goonewardene, Leslie (ගුණවර්ධන). *A Short History of the Lanka Sama Samaja Party*, 1960. https://marxists.catbull.com/history/etol/writers/goonewardene/1960/lssp.htm

Gunasekera, Manisha (ගුණසේකර). 'Gender in Counter-State Political Practice of the JVP 1987-1989.' MA Thesis, Colombo: University of Colombo, 1994.

Fernando, Laksiri (ප්‍රනාන්දු). 'Youth and Politics: Why They Rebel?' (119-138) *Sri Lankan Youth: Challenges and Responses*, eds. S.T Hettige and Markus Mayer, Friedrich Ebert Stiftung, 2002.

Guevara, Ernesto Che (ගුවේරා). Guerrilla Warfare. Ocean Press, 2006

Halliday, Fred (හැලිඩේ). 'The Ceylonese Insurrection.' *New Left Review*, 69 (1971): 55-90.

Harvey, Neil (හාර්වි). 'The Zapatistas, Radical Democratic Citizenship, and Women's Struggles.' *Social Politics: International Studies in Gender, State & Society* 5.2 (1998): 158–187.

Jayawardena, Janaki (ජයවර්ධන). 'Cultural Construction of the "Sinhala Woman" and Women's Resistance to Such Identities.' *Nivedini: Journal of Gender Studies* 12.1 (2006): 82-119.

Jayawardena, Kumari (ජයවර්ධන). 'Religious and Cultural Identity and the Construction of Sinhala Buddhist Womanhood.' *Nivedini* 2.1 (1994): 111-39.

Jayawardena, Kumari (ජයවර්ධන). *The Rise of Labor Movement in Ceylon*. Sanjiva Books, 2004

Kampwirth, Karen (කැම්වර්ත්). 'Also a Women's Rebellion: The Rise of the Zapatista Army.' (83-115) *Women and Guerilla Movements: Nicaragua, El Salvador, Chiapas, Cuba*. Pennsylvania State University Press, 2002.

Kearney, Robert N (කර්නි). 'Educational Expansion and Political Volatility in Sri Lanka: The 1971 Insurrection', *Asian Survey* 15 (1975): 727-744.

Kearney, Robert N. (කර්නි). 'Youth Protest in the Politics of Sri Lanka.' *Sociological Focus (Youth Protest In The 60s)* 13.3 (1980): 293-313.

Kearney, Robert N (කර්නි). 'Women in Politics in Sri Lanka.' *Asian Survey* 21.7 (1981): 729-46.

Kulkarni, Sneha (කුල්කර්නි). 'Women's Approach In Maoist War In India: Naxalite And Anti-Naxalite Strategy.' *IOSR Journal of Humanities And Social Science* 23.6 (2018): 1-6.

Lerski, George Jan (ලර්ස්කි). *Origins Of Trotskyism In Ceylon A Documentary History of the Lanka Sama Samaja Party, 1935-1942*. Stanford University, 1986.

Marx, Karl, and Frederick Engels (මාක්ස් සහ එංගල්ස්). 'Manifesto of the Communist Party.' (98-137) *Marx/Engels Selected Works*, vol 1. Progress Publishers, 1969.

Narain, Akanksha (නාරායින්). 'Roles and Participation of Women in Indian Left-Wing Extremism: From "Victims" to "Victimisers" of Violence.' *Counter Terrorist Trends and Analyses* 9.8 (2017): 12-16.

Obeyesekere, Gananath (ඔබෙසේකර). 'Some Comments on the Social Background of the April 1971 Insurgency in Sri Lanka (Ceylon)', *The Journal of Asian Studies* 33 (1974): 367-384.

Osborne, Peter (ඔස්බෝන්). *How to Read Marx*. W W Norton & Company, 2006.

Panjabi, Kavita (පන්ජාබි). '"Otiter Jed" or Times of Revolution: Ila Mitra, the Santals and Tebhaga Movement.' *Economic and Political Weekly* 45.33 (2010): 53-59.

Politicus (පොලිටිකස්). 'The April Revolt in Ceylon.' *Asian Survay* 12 (1972): 259-274.

Rancière, Jacques (රොන්සියෙර්). 'Politics, Identification, and Subjectivization.' *October* 61 (1992): 58-64.

Rancière, Jacques (රොන්සියෙර්). 'Ten Theses on Politics.' *Dissensus: On Politics and Aesthetics*, London: Continuum, 2010.

Reif, Linda L (රීෆ්). 'Women in Latin American Guerrilla Movements: A Comparative Perspective.' *Comparative Politics* 18.2 (1986): 147–69.

Samaranayake, Gamini (සමරනායක). 'Political Violence in the Third World: A Case Study of Sri Lanka. 1971-1987.' Ph.D Thesis, University of St. Andrews, 1990.

Samaranayake, Gamini (සමරනායක). 'Political Violence in Sri Lanka: A Diagnostic Approach.' *Terrorism and Political Violence* 9.2 (1997): 99-119.

Samaranayake, Gamini (සමරනායක). 'Patterns of Political Violence and Responses of the Government in Sri Lanka, 1971–1996.' Terrorism and Political Violence 11.1 (1999): 110-22.

Shekhawat, Seema, and Chayanika Saxena (ශෙඛාවත් සහ සක්සෙනා). 'Victims or Victimizers? Naxal Women, Violence and the Reinvention of Patriarchy.' (117-31) *Female Combatants in Conflict and Peace: Challenging Gender in Violence and Post-Conflict Reintegration*, ed. Seema Shekhawat, 117-31. New York: Palgrave Macmillan, 2015.

Singha Roy, Debal K (සිංහ රෝයි). 'Peasant Movements and Empowerment of Rural Women.' *Economic and Political Weekly* 30.37 (1995): 2306-11.

Singha Roy, Mallarika (සිංහ රෝයි). 2009. 'Magic Moments of Struggle: Women's Memory of the Naxalbari Movement in West Bengal, India (1967–75).' *Indian Journal of Gender Studies* 16.2 (2009): 205-232.

Singha Roy, Mallarika (සිංහ රෝයි). 'Sexual Economies of Caste and Gender: The Case of Naxalbari (1967–1975).' Working Paper No. 11, Tata Institute of Social Sciences, 2016.

Yuval-Davis, Nira (යුවාල්-ඩේවිස්). *Gender and Nation*. Sage, 1997.

Weerawardhana, Chamindra (වීරවර්ධන). 'Gender and Ethnic Politics in Sri Lanka's Janatha Vimukthi Peramuna.' *Socialism and Democracy* 31.2 (2017): 73–94.

Wickramasinghe, Nira (වික්‍රමසිංහ). *Sri Lanka in the Modern Age: A History*. Oxford University Press, 2014

Wijesinghe, Shanika (විජේසිංහ). 'Patriarchy and Sinhala-Buddhist Nationalism: A Critical Reading of Maname & Sinhabahu.' *Nivedini: Journal of Gender Studies* 14 (2008): 17-44.

Wijeweera, Rohan (විජේවීර). 'Speech to the Ceylon Criminal Justice Commission.' *New Left Review* 84 (1974): 86-104.